# පුස්තකාල ප්‍රවෘත්ති

# நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

20 වන වෙළුම.4 වන කලාපය / 1999 ඔක්තෝබර් - දෙසැම්බර්

மலர் 20. இதழ் 4 ஒக்ரோபர் - டிசெம்பர் 1999

Vol:20, No. 4 / October - December 1999

ISSN 1391 - 0000

# NATIONAL LIBRARY OF SRI LANKA

**Services:**

Reference, Document Delivery; Inter Library Lending Bibliographical, Union Catalogue, Referrel, Reprographic etc. Institutional membership facilities are available.

**Collections:**

* Reference Materials - Encyclopedias, Dictionaries, Year Books, Maps and a collection of Rare books
* Newspaper Collection (from 1976) - Sinhalese, Tamil, English and International Newspapers
* Periodicals
* National & International News Magazines
* Science and Technology Collection
* Library Science Collection
* UNESCO Collection
* Collection of Ola Leaves
* A large collection of Books on Economics, political Science, Social Science, Religion, Linguistics, Geography, History, Art, Music, Sports etc.
* (CD- ROM) facilities for ' Science Citation Index' Library & Information Science Abstracts (LISA PLUS) " HORTCD" and Current Contents on Diskette

**The Reader Services Division of the National Library is open from Tuesday to Saturday from 9.00 a.m. to 5.00 p.m.**

for further details, Please contact:

Head
Reader services Division
National Library of Sri Lanka,
14, Independence Avenue
Colombo 07.

Tele: 685199, 698847

Fax: 685201

# පුස්තකාල ප්‍රවෘත්ති

## நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය ஆரம்பம் Established 1973

20 වන වෙළුම 4 වන කලාපය
1999 ඔක්තෝබර් - දෙසැම්බර්



සංස්කාරක උපදේශක මණ්ඩලය
**හෙන්රි සමරනායක**
සභාපති

**එම්. එස්.යූ. අමරසිරි**
අධ්‍යක්ෂ ජනරාල්

**ජානකී ප්‍රනාන්දු**
නියෝජ්‍ය අධ්‍යක්ෂ

**ප්‍රධාන සංස්කාරක**
යූ. පී. අලහකෝන්

**සහාය සංස්කාරක**
ශ්‍රීමා සූරියබණ්ඩාර



**ප්‍රකාශනය**
ප්‍රකාශන අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකථනය : 685196,698847 - 246
ෆැක්ස් : 941 - 685 - 201



© ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1999


කලාපයක මිල රුපියල් 25.00 $ 2.50
වසරක දායක මුදල රුපියල් 100.00
චෙක්පත් හා මුදල් ඇණවුම්පත්

**සභාපති**
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
නමට යොමුකරන්න


**මුද්‍රණය**
සමයවර්ධන ප්‍රින්ටර්ස්

மலர் 20 இதழ் 4
ஒக்ரோபர் - டிசெம்பர் 1999



பதிப்பாசிரியர் ஆலோசனைக் குழு
ஹென்றி சமரநாயக்க
தலைவர்

எம்.எஸ்.யு. அமரசிறி
பணிப்பாளர் நாயகம்

ஜானகி பெர்னாண்டோ
பிரதிப் பணிப்பாளர்

பிரதம பதிப்பாசிரியர்
யூ .பீ. அழகக்கோன்

உதவிப் பதிப்பாசிரியர்
சிறீமா சூரியபண்டார



**வெளியீடல்**
வெளியீட்டுப் பிரிவு
சிறீ லங்கா தேசிய நூலகம்
தேசிய நூலக ஆவணவாக்கல்
சேவைகள் சபை
சுதந்திரவழி, கொழும்பு 07
சிறீ லங்கா

தொலைபேசி 685196,698847 - 246
பெக்ஸ் 941-685-201



© சிறீ லங்கா தேசிய நூலகம் 1999


பிரதியின் விலை ரூபா- 25.00 $ 2.50
ஆண்டுச் சந்தா ரூபா - 100/=
சகல காசோலைகளும், தபால் கட்டளைகளும்

**தலைவர்**
தேசிய நூலக ஆவணவாக்கல்
சேவைகள் சபையின் பெயருக்கு எழுதப்பட
வேண்டும்.


**அச்சுப் பதிப்பு**
சமயவர்த்தன பிறின்டர்ஸ்

**Volume 20 No.4**
October - December 1999



Editorial Advisory Board
**Henry Samaranayake**
Chairman

**M.S.U. Amarasiri**
Director General

**Janaki Fernado**
Deputy Director

**Editor in Chief**
U..P. Alahakoon

Asst. Editor
Srima Suriyabandara



**Published by**
Publication Division
National Library of Sri Lanka
National Library & Documentation
Services Board
Independence Avenue, Colombo 07.
Sri Lanka.

Tel. 685196, 698847 - 246
Fax : 941 - 685 -201



© National Library of Sri Lanka 1999


Price per Copy Rs. 25.00 $ 2.50
Annual Subscription Rs.100
All Cheques and Money Order
should be forwarded to

**Chairman**
**National Library & Documentation**
**Services Board**


**Printed by**
Samayawardhana Printers

# පටුන


| | |
|---|---|
| පුවත් | 04 |
| செய்திகள் | 04 |
| NEWS | 05 |
| **ග්‍රන්ථ විඥාපන පාලනය** (Bibliographic Control )<br>**පියදාස රණසිංහ** | 06 - 12 |
| நூலக முகாமைத்துவ முறைமையும் தரவுத் தளமும்<br>கிருபா செல்லத்துரை | 14 -18 |
| තොරතුරු සමාජය<br>යූ. පී. අලහකෝන් | 20 - 23 |

කතුවැකිය

# පාසල් පුස්තකාල සංවර්ධනය

අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකිය හැකි පාසල සහ පුස්තකාලය අතර තිබෙනුයේ අවියෝජනීය සබඳතාවකි. ඕනෑම රටක අධ්‍යාපනික ක්‍රියාදාමය තුළ පුස්තකාල පරිහරණයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. එහෙත්, මෙරට පාසැල් අධ්‍යාපන ක්‍රියාවලියේ අංගයක් ලෙසින් පුස්තකාලයට හිමි වී ඇති වැදගත්කම පිළිබඳව කිසිසේත්ම සෑහීමකට පත් විය හැකි නොවේ. විශේෂයෙන් පාසල් අධ්‍යාපනයෙන් පසු වැඩිහිටියකු ලෙසින් සමාජයට එක් වන පුද්ගලයන්ගේ කියවීමේ පුරුදු සහ තොරතුරු කුසලතා වැඩි දියුණු කර ගැනීමට පදනම සකස් වනුයේ පාසල් අධ්‍යාපනය මගිනි. එහෙයින් මෙවන් හැකියාවන්ගෙන් සපිරි පුද්ගලයකු බිහි කිරීම සඳහා පාසල් පුස්තකාලයට සහ පුස්තකාලයාධිපතීන් හට පැවරෙන වගකීම සුළුපටු නොවේ. පාසල් පුස්තකාලය වඩාත් සජීවී ආයතනයක් බවට පත් කරලීමට පුස්තකාලයාධිපතිවරයාට පැවරෙන වගකීම අතිවිශාලය.

ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ පාසල් පුස්තකාල සංවර්ධනයට සුවිශේෂ වැදගත්කමක් ලබා දී ඇත්තේ එහෙයිනි. මන්ද, සජීවී සහ කාර්යක්ෂම පාසල් පුස්තකාලයකින් තොරව ස්වයං අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, ඉගෙනුමට ඉගෙනුම යනාදී නව අධ්‍යාපනික සංකල්ප යථාර්ථයක් බවට පත් කිරීමට අපහසු හෙයිනි. සම්ප්‍රදායික සටහන් මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයෙන් බැහැර වීමට නම් සිසුන්ගේ තොරතුරු කුසලතා වර්ධනය වන ආකාරයේ වැඩ පිළිවෙලක් සම්පාදනය කළ යුතු වේ. විවිධ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සමග බැඳුණු වැඩ සටහන් පාසල් පුස්තකාලය කේන්ද්‍ර කොට ගෙන ඉදිරිපත් කළ හැකිය. කතන්දර පැය, ප්‍රශ්ණ විචාරාත්මක වැඩ සටහන්, ප්‍රහේලිකා තරඟ මේ සඳහා නිදසුන් කිහිපයකි.

පුස්තකාලයාධිපතිවරයාගේ වෘත්තිකභාවය ද පාසල් පුස්තකාල සංවර්ධනයේ දී අවධානයට ලක් විය යුතු කරුණකි. පුස්තකාල සංවර්ධනයේ දී ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් සිදු වන නව ප්‍රවනතා පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කිරීම මගින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථක මැදිහත්කරුවකු වීමට පුස්තකාලයාධිපතිවරයාට අවකාශ සැලසේ. විදුහල්පතිවරුන්, අධ්‍යාපන නිලධාරීන් මෙන්ම පාසල් සිසුන් හා ගුරුවරුන් පාසල් පුස්තකාල පිළිබඳ දරන පසුගාමී ආකල්ප වඩාත් සාධනීය හා යහපත් ආකල්ප බවට පරිවර්තනය කර ගැනීමට ප්‍රධාන වශයෙන් ම ඉවහල් වනුයේ පුස්තකාලයාධිපතිවරයාගේ වෘත්තිකභාවය හා කැප වීම වේ.

පාසල් පුස්තකාලය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අනුබද්ධ, වන පාඨකයන්ගේ කියවීම් පුරුදු සහ තොරතුරු ගවේෂණ කුසලතා ඔප් නංවන සජීවී මධ්‍යස්ථානයක් බවට පත් කරලීම අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන්, පුස්තකාලයාධිපතීන්, ගුරුවරුන් යනාදි පාසල් අධ්‍යාපනයට සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ වගකීම විය යුතු වේ.

**සංස්කාරක**

## පුවත්

### පුහුණු පාඨමාලා

1999 - 10 - 21 සිට 22 දක්වා උතුරු නැගෙනහිර පළාතේ සාහිත්‍ය උළෙල වෙනුවෙන් අම්පාර දෙහිඅත්තකන්ඩිය මධ්‍ය මහා විද්‍යාලයේ දී පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී. පාඨමාලාලාභීන් 35 දෙනෙකු සහභාගි විය.

### ජාතික පුස්තකාල දේශන

1999 ඔක්තොම්බර් - දෙසැම්බර් කාලය තුළ ජාතික පුස්තකාල දේශන මාලාව යටතේ පහත සඳහන් දේශන පවත්වන ලදී.

| දේශක | මාතෘකාව |
|---|---|
| ප්‍රියන්ත කේ. වීරබාහු මහා | - Y2K Awareness for Librarians |
| නිශ්ශංක දිද්දෙනිය මහතා | - නාඩගම් නූර්ති ශෛලියෙන් මනමේ ලැබූ ආභාසය |
| ජෙරල්ඩ් ආර්. බ්‍රවුන් මහතා | - Whats happening in school libraries around the world |

### පොත් ප්‍රදර්ශන

1999 ඔක්තොම්බර් - දෙසැම්බර් කාලය තුළ පහත සඳහන් පොත් ප්‍රදර්ශන සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහභාගි වී ඇත.

| | |
|---|---|
| 1999 - 10 - 01 සිට 03 දක්වා | - සාහිත්‍ය කලා ප්‍රසාදිනි උළෙල නිමිත්තෙන් ඇඹිලිපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ දී |
| 1999 -10 - 14 සිට 15 දක්වා | බෙන්තොට ගාමිණී මහා විද්‍යාලයේ දී |
| 1999 - 10 - 23 | - ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ දී හා බෙන්තොට ගාමිණී මහා විද්‍යාලයේ දී 1999.10.14 -15 |

## செய்திகள்

### பயிற்சி திட்டங்கள்

வடக்கு கிழக்கு மாகாணத்தைச் சேர்ந்த நூலகர்களுக்கான பயிற்சி வகுப்பொன்று 1999 ஒக்ரோபர் மாதம் 21-22 ஆம் திகதிகளில் தெஹியத்தக் கண்டிய மத்திய மகா வித்தியாலயத்தில் நடத்தப்பட்டது. இந் நிகழ்ச்சியில் 35 பயிலுநர்கள் பங்குபற்றியிருந்தனர்.

### தேசிய நூலகப் பேருரைத் தொடர்

1999 ஒக்ரோபர் - டிசெம்பர் காலப்பகுதியில் தேசிய நூலக பேருரைத் தொடரின் கீழ் நடாத் தப்பட்ட பேருரைகளின் தலைப்பும் பேருரை யாளர் களின்பெயரும் கீழே தரப்பட்டுள்ளன.

| பெயர் | தலைப்பு |
|---|---|
| திரு. பிரியந்த கே. வீரபாகு | - Y2K Awareness for Librarians |
| திரு. திஸ்ஸங்க தித்தெனிய | - நாடகக் கலையும் மனமே நாடகமும் |
| திரு. ஜெரல்ட் ஆர் பிரவுண் | - What happening in School Libraries around the world |

### நூற் கண்காட்சிகள்

1999 ஆம் ஆண்டின் இறுதிக் காலாண்டுப் பகுதியில் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் பின்வரும் நூற் கண்காட்சி ஒழுங்கு செய்யப்பட்டிருந்தது .

| | |
|---|---|
| ஒக்ரோபர் 01-03 | - எம்பிலிப்பிட்டிய மத்திய மகா வித்தியாலயம் |
| ஒக்ரோபர் 14-15 | - பெந்தோட்டை, காமினி மகாவித்தியாலயம் |
| ஒக்ரோபர் 23-04 | - சிறீ ஜயவர்த்தனபுர பல்கலைக்கழகம் |

### செய்து காட்டுதல்கள்

பிரித்தானிய கவுன்சில் மண்டபத்தில் 1999 நொவம்பர் 25 ஆம் திகதி விண்டோவுடன் இணைந்த "பூர்ணா" என்னும் நூலக தகவல் தொகுதி ஒன்று தொடர்பாக விளக்கமளிக்கப்பட்டு நிரூபித்தும் காட்டப் பட்டது. இந் நிகழ்ச்சியானது இலங்கை நூலக சங்கத் தினால் ஒழுங்கமைக்கப்பட்டிருந்தது.

# NEWS

## Exhibitions

Following book exhibitions were orgenized by the National Library and Documentation Services Board during the last quater of 1999.

| | |
|---|---|
| 01-03- Oct. 1999 | - Ambilipitiya Madya Maha Vidyalaya |
| 14 - 15 Oct | - Gamini Maha Vidyalaya Bentota |
| 23 Oct | - University of Sri Jayawardanapura |

## Demonstration

The Demonstration of PURNA: Windows Based Integrated Library Information System was held on 25 November 1999 at the British Council Hall. The program was organized by the Sri Lanka Library Association.

## Training Programs

Traing course for librarians in North and East Province was held from 21 - 22 October 1999 at the Dehiattakandiya Madya Maha Vidyalaya. 35 trainees were participated at this program.

## National Library Lecture Series

Following are the topics and lecturers of the National Library Lecture series during the period of October - December 1999

| **Lecturer** | **Topic** |
|---|---|
| Mr. Priyantha K.Weerabahu | Y2K Awareness for Librarians |
| Mr. Nissanka Diddeniya | නාඩගම් නූර්ති ශෛලියෙන් මනමේ ලැබූ ආභාසය |
| Mr. Gerald R. Brown | Whats happening in school libraries around the world |

## International Conferences

The Sri Lanka Library Association (SLCA) in collabaration with the International Federation of Library Associations and Institutions (IFLA) organized a works top on Networking for Effective Libraries and Information Servives (NETELIS) which was held from 17 - 23 October 1999 at Hotel Guladari, Colombo.

පළවූ අළුත්ම
පොත පත

පිළිබඳ
නිවැරදි තොරතුරු
ලබා ගැනීමට

බලන්න
ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ
නාමාවලිය

# ග්‍රන්ථ විඥාපන පාලනය
# (Bibliographic Control)

පියදාස රණසිංහ
අංශ ප්‍රධාන
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

පෘථුලාර්ථයෙන් ගත් කල්හි මිනිස් දැනුමට අදාළ සියලු ම ලිඛිත හා ප්‍රකාශිත වාර්තා පිළිබඳව ඇති අවබෝධය ( mastery over written and published records) ග්‍රන්ථ විඥාපන පාලනය වශයෙන් හැඳින්විය හැකි ය. තවදුරටත් විග්‍රහ කළ හොත් සමස්ත මානව ඥානය හා තොරතුරු නිරූපණය කරන සියලු ම ආකාරයේ ප්‍රකාශිත හා අප්‍රකාශිත ද්‍රව්‍ය, එනම් මුද්‍රිත, ශ්‍රව්‍ය-දෘශ්‍ය හෝ වෙනත් ස්වරූපවලින් ඉදිරිපත් වන දෑ පිළිබඳ විස්තර ප්‍රමාණවත් ලෙස වාර්තාගත කරන්නා වූ ක්‍රමයක් දියුණු කිරීම හා පවත්වා ගෙන යාම ඉන් අදහස් කෙරේ[1]. එවැනි ක්‍රමයක් හෙවත් ග්‍රන්ථ විඥාපන පාලනයක් අවශ්‍ය වන්නේ මානව වර්ගයාගේ ප්‍රගතියට හේතු වන්නා වූ වාර්තාගත ඥානයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා ය. සමස්ත ලෝකවාසී මානවයන් විසින් නිෂ්පාදිත සාහිත්‍යය හෙවත් දැනුම වෙත පිවිසීම, කළමනාකරණය හා සංනිවේදනය සඳහා එකී දැනුම අන්තර්ගත වාර්තා සංවිධානය කොට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ග්‍රන්ථ විඥාපන පාලනයේ මූලිකත්වය ගෙන කටයුතු පුස්තකාලයාධිකාරිත්වයේ භාරය වේ.[2]

මිනිසා දැනුම හා තොරතුරු බිහි කරයි. ඒවා ලිඛිත, මුද්‍රිත , ශ්‍රව්‍ය-දෘශ්‍යාදි විවිධ ස්වරූපවලින් වාර්තාගත කරයි. නව දැනුම හා තොරතුරු බිහි වන්නේ එසේ වාර්තා ගත පැරණි දැනුම හා තොරතුරු පදනම් කොට ගෙන ය. එහෙයින් දැනුම හා තොරතුරු සොයා යන්නවුන් උදෙසා පවත්නා දැනුම් හා තොරතුරු වාර්තා පිළිබඳ විස්තර සැපයීම අවශ්‍ය ය. එසේ නො වුවහොත් ලොව පුරා දැනුම හා තොරතුරු ප්‍රචාරණයක් සිදු නොවේ. දැනුම හා තොරතුරු ප්‍රචාරණයක් සිදු නො වන ලොවක මානව සංවර්ධනයක් ද හට නොගනී. ග්‍රන්ථ විඥාපන පාලනය ඉතා වැදගත් කාරණයක් බවට පත් වන්නේ මේ නිසා ය.

ග්‍රන්ථ විඥාපන පාලනය ප්‍රධාන වශයෙන් තල දෙකකින් සමන්විත ය.

(1) ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය (National Bibliographic Control ) හා

(2) විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය ( Universal Biblio graphic Control) යනුවෙනි.

## ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය

කිසියම් දේශයක් හෙවත් රටක් තුළ විවිධ මාධ්‍යයන්ගෙන් ප්‍රකාශයට පත් කැරෙන්නා වූ විවිධාකාර ප්‍රකාශන හඳුනා ගෙන එකී ප්‍රකාශන සම්බන්ධ නිවැරදි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් වාර්තා හැකි ඉක්මනින් පිළියෙළ කොට උපයෝජකයන්ගේ ප්‍රයෝජනය සඳහා මුද්‍රිත හෝ වෙනත් ස්වරූපයකින් අඛණ්ඩව ඉදිරිපත් කිරීම ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය වශයෙන් හැඳින්විය හැකි ය. ලොව බොහෝ රටවල මේ කාර්යය සඳහා කැපවුණු ජාතික මට්ටමේ ආයතන තිබේ. ඒ ඒ රටවල ජාතික පුස්තකාල නිදසුන් ය.

## විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය

ලෝකයේ සියලු ම රටවල ප්‍රකාශිත සියලු ම වර්ගයේ ප්‍රකාශන පිළිබඳ මූලික ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත ජාත්‍යන්තර වශයෙන් පිළිගත හැකි ස්වරූපයකින් ලොව පුරා වෙසෙන උපයෝජකයන්ට නො පමාව ලබා ගැනීමට ඉඩ සැලැස්වීම විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනයේ අරමුණ යි. විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය රඳා පවත්නේ ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය මත ය. එහෙයින් සාර්ථක ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයක් නො වන්නේ නම් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය සාක්ෂාත් කර ගත නො හැකි ය.

## ප්‍රකාශන සුලභතාව

ග්‍රන්ථ විඥාපන පාලනය හා බැඳුණු, පසු කලෙක සංවර්ධනය වූ තවත් වැදගත් සංකල්පයක් තිබේ. එනම් ප්‍රකාශන සුලභතාවය යි. (Availability of publications ) යහපත් ග්‍රන්ථ විඥාපන පාලනයක් පැවතුණහොත් උපයෝජකයනට තමනට අවශ්‍ය ප්‍රකාශන මොනවා ද යන්න හඳුනා ගත හැකි ය. එහෙත් අවශ්‍ය ප්‍රකාශන හඳුනා ගැනීම පමණක් නො සෑහේ. එම ප්‍රකාශන සාධාරණ කාල සීමාවක් තුළ ස්වකීය පරිහරණය සඳහා ලබා ගැනීමේ හැකියාවක් ද උපයෝජකයාට තිබිය යුතු ය. ඒ ප්‍රකාශනවල අන්තර්ගත දැනුම ඔහුට ලබා ගත හැක්කේ එවිට පමණි. ප්‍රකාශන සුලභතාව ද ජාතික ප්‍රකාශන සුලභතාව (National Availability of Pub-lications ) හා විශ්ව ප්‍රකාශන සුලභතාව (Universal Availability of Publications ) යනුවෙන් ද්විධාකරණය කළ හැකි ය.

## විශ්ව ප්‍රකාශන සුලභතාව

ජාතික ප්‍රකාශන සුලභතාව යනු ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය යටතේ ඒ ඒ රට විසින් වාර්තාගත කරනු ලබන ප්‍රකාශන පිළිබඳ දත්ත ඇසුරින් ඒ ඒ රටෙහි සිටින උපයෝජකයනට අවශ්‍ය වූ විටෙක එකී ප්‍රකාශන නො පමාව ලබා ගැනීමට ඇති හැකියාව යි.

ඉහත දක්වන ලද තත්ත්වය ජාතික සීමාවන් ඉක්මවා ගිය කල්හි රට විශ්ව ප්‍රකාශන සුලභතාව යැයි කිව හැකි ය. එහි ඉලක්කය වන්නේ ලොව පුරා ප්‍රකාශයට පත් වී ඇති කවර දැයක් වුව ලොව කුමන ස්ථානයක දී කුමන අවස්ථාවක දී වේවා උපයෝජකයන්ට ලබා ගැනීමට අවකාශ සැලසීම යි.[3]

## ග්‍රන්ථ විඥාපන පාලනයේ ඉතිහාසය

ග්‍රන්ථ විඥාපන පාලනය පුස්තකාල හා විඥාපන විද්‍යාවේ ප්‍රමුඛ සංකල්පයක් ලෙස ඉදිරිපත් වන්නට පටන් ගත්තේ 20 වන සියවසේ මැද භාගයේ දි [4] පමණ වුව ද එය කිසිසේත් ම නව සංකල්පයක් නො වේ.

ස්වකීය අත්දැකීම්, දැනුම හා මතකය කාලය හා අවකාශය ඉක්මවා සංනිවේදනය කරනු සඳහා මිනිසා අක්ෂර ලේඛන කලාව හා භාෂාව සංවර්ධනය කර ගත්තේ ය. ආදිතම අවධිවල පටන් ඔහු ඒ ඒ වකවානුවේ පැවැති තාක්ෂණය අනුව ගල්,මැටි පුවරු, ගස් පොතු හා කොළ, කඩදාසි ආදි විවිධ ද්‍රව්‍යවල සිය දැනුම වාර්තාගත කෙළේ ය. [5]මේ දැනුම් වාර්තා පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනයක් එකල පවා අවශ්‍ය විය. ඇලෙක්සැන්ඩ්‍රියානු ආදි පුරාණතම පුස්තකාලවල පවා ඒවායේ අන්තර්ගත ලේඛන පිළිබඳව සූචි සම්පාදනය කරන ලද්දේ මෙකී අවශ්‍යතාව සපුරාලීමට ය.

කෙසේ වෙතත්, දැනුම් වාර්තා හෙවත් පොත පත සුලභ නො වූ අතීත අවධිවල ග්‍රන්ථ විඥාපන පාලනය එතරම් බරපතළ ප්‍රශ්නයක් වූයේ නැත. එහෙත් 16 වන සියවසේ දි මුද්‍රණ ශිල්පය ප්‍රචාරය වීමත් සමඟ පොත ආර්ථික භාණ්ඩයක් බවට පත් විය. ග්‍රන්ථ නිෂ්පාදනය හා බෙදා හැරීම වාණිජ ව්‍යාපාරයක් වූයේ ය. මුද්‍රණ යන්ත්‍රයේ ආනුභාවය කරණ කොට ගෙන හට ගත් ග්‍රන්ථ බාහුල්‍ය නිසා පොත් වෙළෙඳුන්ට ඔවුන් විසින් නිෂ්පාදිත ග්‍රන්ථ පිළිබඳ තොරතුරු පාඨකයන්ට දැනුම් දීම සඳහා ලැයිස්තු සකස් කරන්නට සිදු විණි.

මේ අයුරින් මෑත කාලීන සියවස්වල ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ මුල් ම පියවර තබන ලද්දේ පොත් වෙළෙඳුන් විසිනි. විශේෂයෙන් ම ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් හා ලයිප්සිග් නගරවල ක්‍රිස්තියානි දේවස්ථාන උත්සවවල දි පවත්වන ලද පොත් සල්පිල් සඳහා සකස් කරන ලද Messkataloge නමැති ග්‍රන්ථ නාමාවලි මෙහි දි වැදගත් වේ.[6]

අවුස්බර්ග්හි ( Ausberg) පොත් වෙළෙඳකු වූ ජෝර්ජ් විලර් විසින් 1564 දි සම්පාදිත ග්‍රන්ථ නාමාවලිය මේ අතුරින් පළමුවැන්න වෙයි.[7] ජර්මනියෙන් ආරම්භ වූ මේ වෙළෙඳ ග්‍රන්ථ නාමාවලි සම්ප්‍රදාය පසුකාලීනව යුරෝපයේ සෙසු ප්‍රදේශවලට ද ව්‍යාප්ත වී ගියේ ය. මේ සමඟ ම ග්‍රන්ථ නාමාවලිකරණය විද්වතුන්ගේ හා පුස්තකාලයාධිපතීන්ගේ කාර්ය භාරයක් බවට පත් වූ අයුරු ද නිරීක්ෂණය කළ හැකි ය. රජයේ අධිකාරිත්වය සහිතව ග්‍රන්ථ විඥාපන පාලනයට පළමුවරට අත ගසන ලද්දේ ප්‍රංශය යි. ඒ වර්ෂ 1811 දි නැපෝලියන්ගේ ආඥාවක් අනුව නිකුත් කරන්නට පටන් ගත් Bibliographie de la France නමැති ග්‍රන්ථ නාමාවලියත් සමඟ ය.[8]

19 වන සියවස ආරම්භ වන විට ග්‍රන්ථ විඥාපන පාලනයේ වැදගත්කම බටහිර ලෝකයේ ප්‍රධාන රටවල ජාතික පුස්තකාල මෙන් ම විද්වතුන් විසින් ද මැනවින් වටහා ගෙන තිබූ බව පෙනේ. ජාතික ග්‍රන්ථ විඥාපන පද්ධතියක අවශ්‍යතාව හා එවැන්නක අන්තර්ගත විය යුතු ගුණාංග පිළිබඳව මුල් වරට අදහස් දක්වන ලද්දේ ෆ්‍රැන්ක් කෑම්ප් බෙල් (1863-1906) විසිනි.[9] වත්මන්හි ජාත්‍යන්තර ප්‍රලේඛන සංවිධානය හෙවත් FID (International Federation for Documentation ) යනුවෙන් හැඳින්වෙන ජාත්‍යන්තර ග්‍රන්ථ විද්‍යා ආයතනය හෙවත් IIB ( Institut International de Bibliographie ), හෙන්රි ලා ෆොන්ටේන් හා පෝල් ඔට්ලට් යන දෙපළ විසින් ආරම්භ කරන ලද්දේ ද මේ වකවානුවේ දි ය. එනම් 1895 දි ය. පූර්ණ විශ්ව ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කිරීම ඔවුන්ගේ අභිප්‍රාය වූ අතර 1920 වන විට සංලේඛ එක් කෝටි හය ලක්ෂයක් පළමුව ඩිවි දශම වර්ගීකරණය අනුව ද, පසුව ඒ සඳහා ම සංවර්ධනය කරන ලද විශ්ව දශම වර්ගීකරණ ක්‍රමය අනුව ද ගොනු කරන්නට ඔවුනට හැකි විය. මේ වූ කලී මෑත ඉතිහාසයේ විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය විෂයයෙහි දරන ලද ප්‍රථම ප්‍රයත්නය වශයෙන් හැඳින්විය හැකි ය.[10]

කෙසේ වෙතත් ග්‍රන්ථ විඥාපන පාලනය ජාත්‍යන්තර සංකල්පයක් ලෙස වර්ධනය වන්නට පටන් ගත්තේ 20 වන සියවසේ මැද භාගයේ පමණ සිට ය. ඒ වර්ෂ 1946 හි යුනෙස්කෝ සංවිධානය ආරම්භ කිරීමෙන් ඉක්බිති ය. යුනෙස්කෝ ව්‍යවස්ථාවට අනුව දැනුම ප්‍රචාරණය වර්ධනය කිරීම එහි මූලික අරමුණක් විය. ලොව සියලු ම රටවල ජනතාවට ඕනෑ ම රටක මුද්‍රිත හෝ ප්‍රකාශිත ද්‍රව්‍යවලට පිවිසීමට ඉඩ සැලැස්වීම් මේ ව්‍යවස්ථාව අනුව යුනෙස්කෝවේ ප්‍රධාන කාර්ය භාරයක් බවට පත් විණි. [11] මේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා යුනෙස්කෝව විසින් නො පමාව පියවර ගත යුතු බවට විවිධ සංගම් හා සංවිධාන මගින් බලපෑම් ද එල්ල විය.

ඒ ඒ රටවල පළවන සියලු ම ආකාරයේ ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය කිරීම සඳහා යුනෙස්කෝව ඇතුළු ජාතික ආයතන හා පුස්තකාල සංගම් මැදිහත් විය යුතු බව නිර්දේශ කරමින් වර්ෂ 1946 දි ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රින්සෙටන් සරසවියේ පැවති ජාත්‍යන්තර, සංස්කෘතික, අධ්‍යාපනික හා විද්‍යාත්මක හුවමාරුව පිළිබඳ සම්මන්ත්‍රණය [12] මෙහි ලා නිදසුනකි.

ග්‍රන්ථ විඥාපන කටයුතු පිළිබඳව නූතන ලෝකයේ ප්‍රථම ජාත්‍යන්තර සම්මේලනය වර්ෂ 1950 දි යුනෙස්කෝව විසින් පැරිසියේ දි පවත්වන ලදි. මේ සම්මේලනය ග්‍රන්ථ විඥාපන සේවා දියුණු කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (International Conference on the Improvement of Bibliographical Services ) යනුවෙන් හැඳින්වේ. මේ සම්මේලනයට පාදක වූයේ යුනෙස්කෝවේ ඉල්ලීම මත කොංග්‍රස් පුස්තකාලය මගින් ලෝකයේ ග්‍රන්ථ විඥාපන සේවාවන් පිළිබඳව කරන ලද සමීක්ෂණය[13] යි. තදනන්තර කාල පරිච්ඡේදයේ දි යුනෙස්කෝව විසින් ජාතික පුස්තකාල හා පුස්තකාල සේවා සැලසුම්කරණය සම්බන්ධව දිල්ලිය (1955), මැනිලා (1964), ක්විටෝ (1966) සහ කොළඹ (1967) යන ස්ථානවල දි ජාත්‍යන්තර සම්මේලන පවත්වන ලදි. මේ සම්මන්ත්‍රණ හැරුණු විට 1958 දි වියනා හි පවත්වන ලද රැස්වීම ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය හා එවැන්නකට අවශ්‍ය සංවිධානාත්මක ව්‍යුහය ගැඹුරින් සලකා බැලූ සමුළුවකි. මෙය යුරෝපයේ ජාතික පුස්තකාල පිළිබඳ සමුළුවක් ලෙස හැඳින්වේ. ජාතික පුස්තකාල මගින් ඉටු කැරෙන කාර්යයන් මෙන් ම ඒවායේ විෂය පථයට හසු විය යුතු වෙනත් කටයුතු ද මේ සමුළුවේ දි පළමුවරට විශ්ලේෂණයට භාජනය විය. ජාතික පුස්තකාලයක් සතු භූමිකාව හා ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයෙහි ලා එහි දායකත්වය පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද්දේ මේ සමුළුවේ දි ය. [14]

මේ වකවානුවේ දි ම පුස්තකාල සංගම් හා ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය හෙවත් IFLA (International Federation of Library Associations and Institutes ) විසින් ග්‍රන්ථ විඥාපන පාලනයට අදාළ කරුණු පිළිබඳව ස්වකීය අවධානය යොමු කරන්නට පටන් ගෙන තිබිණි. යුනෙස්කෝවේ ආධාර ඇතිව IFLA සංවිධානයේ සූචිකරණ කමිටුව මගින් වර්ෂ 1955 දි, පවත්නා සූචිකරණ නීති පිළිබඳව කුඩා අධ්‍යයනයක් සිදු කැරිණි[15]. මේ අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස සූචිකරණ කටයුතු ප්‍රමිතිකරණය පිළිබඳ ප්‍රථම ජාත්‍යන්තර සම්මේලනය වන සූචිකරණ මූල ධර්ම පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (International Conference on Cataloguing Principles ) වර්ෂ 1961 දි පැරිස් නගරයේ දි පවත්වනු ලැබිණි. ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර සංලේඛ කරණයේ දි අනුගමනය කළ යුතු

මූලධර්ම පිළිබඳව මෙහි දී ඇති කර ගත් සම්මුති තවමත් ජාත්‍යන්තර සූචිකරණ කටයුතුවල හරය වශයෙන් පවතී.

ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධව මීළඟ වැදගත් සිදුවීම වූයේ 1969 දී කෝපන්හාගන් නුවර දී පැවැත්වුණු IMCE හෙවත් සූචිකරණ විශේෂඥයන්ගේ ජාත්‍යන්තර රැස්වීම යි (Internatiional Meeting of Cataloguing Experts). IFLA විසින් සංවිධානය කරන ලද මේ රැස්වීමේ දී ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාවල සමරූපිතාවක් ඇති කිරීම ගැන විමසා බැලිණි. IMCE අධ්‍යයනවලින් හෙළි වූ කරුණක් නම් ලෝකයේ විවිධ රටවල ග්‍රන්ථ විඥාපන වාර්තාවන්හි ග්‍රන්ථ විද්‍යා විස්තර බොහෝ දුරට සමානතාවක් උසුලන හෙයින් ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරයක් සංවර්ධනය කිරීමේ ඉඩ ප්‍රස්තා ඇති බවයි. එහෙයින් මේ සඳහා ක්‍රියාකාරී කමිටුවක් ද පත් කරන ලදි. එක් එක් රට කිසියම් ජාතික ආයතනයක් මගින් සිය රටේ පළවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ප්‍රමිත ජාත්‍යන්තර ග්‍රන්ථ විස්තරයක් අනුව ඉදිරිපත් කිරීමෙන් ජාත්‍යන්තර වශයෙන් ග්‍ර ථ විද්‍යාත්මක තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රමයක් සම්පාදනය කර ගත යුතු බව 1969 රැස්වීමේ දී තීරණය කැරිණි.[16]. IFLA විසින් දියත් කරන ලද විශ්ව ග්‍රන්ථ විඥාපන පාලන (UBC) වැඩ සටහනේ පදනම වූයේ මෙකී තීරණය යි.

විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය හෙවත් UBC, 1973 දී ග්‍රිනෝබෝල්හි පැවැත්වුණු IFLA සම්මේලනයේ තේමාව විය. විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධව මෙහි දී ගන්නා ලද තීරණ 1974 දී පැරිස් නුවර පැවැත්වුණු ජාතික ප්‍රලේඛන, පුස්තකාල හා ලේඛනාල යටිතල සැලසුම්කරණය පිළිබඳ යුනෙස්කෝ අන්තර් රාජ්‍ය සමුළුව හෙවත් NATIS (Unesco Intergovernmental Conference on the Planning of National Documentation, Library and Archive Infrastrucfure) සමුළුවට ඉදිරිපත් කරන ලදි. මේ අතර IFLA සංවිධානය ස්වකීය සූචිකරණ ලේකම් කාර්යාලය (Cataloguing Secretariat) විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ ජාත්‍යන්තර කාර්යාලය (IFLA International Office for UBC) බවට පත් කරනු ලැබිණි.

NATIS සමුළුවට ඉදිරිපත් කරන ලද විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ IFLA වැඩ සටහන ලොව බොහෝ රටවල නියෝජිතයන් විසින් පිළි ගැනිණි[17].

එසේ පිළි ගන්නා ලද මූලික සංකල්ප මෙසේ ය:

## 1. අර්ථ නිරූපණ හා සාරාංශය

පුස්තකාල සංගම් හා ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IFLA) ස්වකීය විශ්ව ග්‍රන්ථ විඥාපන පාලන වැඩ සටහන යටතේ යුනෙස්කෝවට මෙසේ යෝජනා කරයි:

ග්‍රන්ථ විඥාපන තොරතුරු පාලනය හා හුවමාරුව සඳහා විශ්ව ව්‍යාප්ත ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම යුනෙස්කෝව විසින් ප්‍රධාන ප්‍රතිපත්ති අරමුණක් සේ පිළි ගත යුතු ය. එබඳු ක්‍රමයක අරමුණ වන්නේ සියලු ම රටවල ප්‍රකාශිත සියලු ම ප්‍රකාශන පිළිබඳ මූලික ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත ජාත්‍යන්තර ව පිළි ගත හැකි ස්වරූපයකින් ලොව පුරා හැකි ඉක්මනින් ලබා ගැනීමට ඉඩ සැලැස්වීම ය.

විශ්ව ග්‍රන්ථ විඥාපන සංකල්පයේ දී පුළුල් පරාසයක ප්‍රකාශන හා පුස්තකාල කටයුතු ආවරණය කරන ජාතික සංඝටකවලින් නිමැවුණු ජාල පද්ධතියක් ද, ජාත්‍යන්තර මට්ටමින් එම ජාල පද්ධති සියල්ල එක් වී සමස්ත ක්‍රමය සකස්වීම ක් ද අපේක්ෂිත ය.

### 1.1 ජාතික මට්ටමේ දී විශ්ව ග්‍රන්ථ විඥාපන පාලන අවශ්‍යතා

මේ ක්‍රමය ජාතික මට්ටමින් ක්‍රියාත්මකවීමේ දී පහත දැක්වෙන අවශ්‍යතා පූරණය විය යුතු ය.

අ) නව ප්‍රකාශනයක් නිකුත් වූ විගස ම රට අදාළ ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාව සැකසීමට ඉඩ සැලසෙන ක්‍රම ස්ථාපනය කිරීම (නීතිමය තැන්පතු, රට සමාන රාජ්‍ය නීති හෝ ස්වේච්ඡා ගිවිසුම්)

ආ) ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තා සකස් කිරීම සඳහා යාන්ත්‍රණයක් හෙවත් ජාතික ග්‍රන්ථ විඥාපන ආයතනයක් පිහිටුවීම. මේ ආයතනය මගින්

1) එම රටේ ප්‍රකාශයට පත් කරනු ලබන හැම නව ප්‍රකාශනයක් සඳහා ම සාධිකාරී ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තා සකස් කරනු ඇත.

11) එම වාර්තා හැකි තරම් කෙටි කලක් තුළ දී නිරතුරුව පළ වන ජාතික ග්‍රන්ථ නාමාවලියක් මගින් ප්‍රකාශයට පත් කරනු ඇත.

111) එම වාර්තා ප්‍රමිතිගත භෞතික ස්වරූපයකින් (පත්‍රික, යන්ත්‍ර පාඨ්‍ය පට හෝ වෙනත් පිළි ගත හැකි විකල්ප) නිපදවා බෙදා හරිනු ඇත.

1v) වෙනත් ජාතික ග්‍රන්ථ විඥාපන ආයතන මගින් නිෂ්පාදිත සමාන වාර්තා සිය රටට ලබා ගෙන බෙදා හරිනු ඇත.

v) ක්‍රමයෙන්, ඉඩ ලැබෙන පරිදි, රටෙහි ප්‍රකාශිත නිෂ්පාදිතය පිළිබඳ පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලියක් බිහි කරනු ඇත.

### 1.2 ජාත්‍යන්තර මට්ටමේ දී විශ්ව ග්‍රන්ථ විඥාපන පාලන අවශ්‍යතා

ජාත්‍යන්තර මට්ටමේ දී සමස්ත විශ්ව ග්‍රන්ථ විඥාපන ජාතික ග්‍රන්ථ විඥාපන ආයතන සියල්ල ඒකාබද්ධ කිරීම පහත සඳහන් කරුණු ලොව පුරා අවබෝධ කර ගැනීම හා පිළි ගැනීම මත රඳා පවතී.

1) එක් එක් ජාතික ග්‍රන්ථ විඥාපන ආයතනය ඒ ඒ රටේ පළ වන ප්‍රකාශන පිළිබඳ සාධිකාරී ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තා බිහි කිරීම සම්බන්ධ වගකීම උසුලන බව

11) ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තා බිහි කිරීමට අදාළ ජාත්‍යන්තර ප්‍රමිති

1) වාර්තාවල අන්තර්ගතය පිළිබඳ ප්‍රමිති: සාධිකාරී වාර්තාවක ඇතුළත් විය යුතු අංග; එකී අංගවල අනුක්‍රමය; එම අංග හා ඒවායේ කාර්යයන් හඳුනා ගැනීම

11) වාර්තාවල භෞතික ස්ව රූපය: යන්ත්‍ර පාඨ්‍ය වාර්තාවල සමරූපිතාව; සූචි පත්‍රිකා ප්‍රමිතිකරණය[18]

විශ්ව ග්‍රන්ථ විඥාපන සංකල්පයට පාදක වන මූලික සාධක දෙකක් තිබේ. එකක් නම් තම රටේ කතුවරුන් විසින් බිහි කරනු ලබන ප්‍රකාශන හඳුනා ගැනීමට හා වාර්තා කිරීමට යෝග්‍යතම ආයතනය ඒ රට ම බව පිළි ගැනීම යි. දෙවැන්න නම් එබඳු වාර්තා සකස් කිරීමේ දී සියලු ම රටවල් විසින් ජාත්‍යන්තර ග්‍රන්ථ විඥාපන ප්‍රමිති පිළි ගත යුතු බවයි.[19]

20 වන සියවසේ දෙවන භාගයේ මුල් කාර්තුවෙහි ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳව ලොව බොහෝ රටවල සුවිශේෂ උද්‍යොගයක් හට ගැනීමට තුඩු දුන් හේතු කිපයකි. ඉන් එකක් නම් 1950 හා 1960 දශකවල හට ගත් ග්‍රන්ථ නිෂ්පාදන ශීඝ්‍රතාවය යි. මුද්‍රිත ග්‍රන්ථ නිෂ්පාදනය පෙර කිසි කලෙක නො වූ විරූ අයුරින් ඉහළ යාම නිසා, එකී

ග්‍රන්ථවලින් ප්‍රයෝජන ගැනීමට අපේක්ෂා කරන්නවුන්ගේ පහසුව පිණිස, ඒවා පිළිබඳ විධිමත් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කර ගැනීම පෙර ට වඩා අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් විය.

ඇතැම් පුස්තක සහයෝගිතා වැඩ සටහන් ද ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ උද්‍යෝගය දල්වා ලන්නට හේතු වූ බව පෙනේ. කොංග්‍රස් පුස්තකාලීය සහාග සුචිකරණ වැඩ සටහන එවැන්නකි. කොංග්‍රස් පුස්තකාලයට ලබා ගන්නා වෙනත් රටවල ප්‍රකාශිත ප්‍රකාශන සඳහා සුචි සංලේඛ සම්පාදනයේ දී එම ප්‍රකාශන බිහි වූ රටවල, ඒවාට පිළියෙළ කළ ග්‍රන්ථ නාමාවලි උපයෝගි කර ගත හැකි බව පෙනුණි. ඉහතින් සඳහන් කළ 1969 දී පැවැති IMCE හෙවත් සූ විශේෂඥයන්ගේ ජාත්‍යන්තර රැස්වීම මේ වැඩ සටහනේ ප්‍රතිඵලයකි.

මේ හැරෙන්නට 1970 දශකයේ මුල් භාගයේ දී ජාත්‍යන්තර විඥාපන ජාල පද්ධති බිහි කිරීම කෙරේ සුවිශේෂ අවධානයක් යොමු කිරීම ද ග්‍රන්ථ විඥාපන පාලන ක්ෂේත්‍රයේ නව නැම්මකට තුඩු දුන් බව පෙනේ. පරමාණුක බල ශක්තිය පිළිබඳ ජාත්‍යන්තර විඥාපන පද්ධතිය හෙවත් INIS ( International Information System for Atomic Energy ) හා එම අත්දැකීමේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ කෘෂිකර්මය පිළිබඳ ජාත්‍යන්තර විඥාපන පද්ධතිය හෙවත් AGRIS ( International Information System in Agriculture ) මීට නිදසුන් ය. මේ අතර 1971 දී පවත්වන ලද යුනෙස්කෝ අන්තර්ර සම්මන්ත්‍රණයේ දී UNISIST ( Inter-governmental Program for Cooperation in the Field of Scientific and Technological Information ) හෙවත් විද්‍යාත්මක හා තාක්ෂණික ක්ෂේත්‍රයේ සහයෝගි තාව පිළිබඳ අන්තර් රාජ්‍ය වැඩ සටහන පිළි ගැනීමත් සමඟ වාර සඟරා පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනය අරමුණු කොට ගෙන ජාත්‍යන්තර මාලික දත්ත පද්ධතිය හෙවත් ISDS ( International Serials Data System) බිහි විය.

ජාතික හා ජාත්‍යන්තර ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධව 1970 දශකයේ සිදු වූ වැදගත් ම සිදුවීම වන්නේ 1977 දී පැරිසියෙහි පැවැත්වුණු ජාතික ග්‍රන්ථ නාමාවලි පිළිබඳ ජාත්‍යන්තර සමුළුවයි (International Congress on National Bibliographies). ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති මාලාවක් පළමුවරට ඉදිරිපත් කරන ලද්දේ යුනෙස්කෝව හා IFLA විසින් සංවිධානය කරන ලද මේ සමුළුවේ දී ය. බොහෝ රටවල ජාතික ග්‍රන්ථ විඥාපන පාලන ආයතන විසින් මේ ප්‍රමිති පිළි ගැනිණි.

විශ්ව ප්‍රකාශන සුලභතා සංකල්පය ප්‍රථම වරට ඉදිරිපත් වූයේ 1976 දී සියෝල් නුවර පවත්වන ලද IFLA සම්මන්ත්‍රණයේ දී ය. විශ්ව ප්‍රකාශන සුලභතාව වෙනුවෙන් කැප වූ එක් සම්මන්ත්‍රණ පත්‍රිකාවක් මෙහි දී ඉදිරිපත් කැරිණි. එවක් පටන් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය හා විශ්ව ප්‍රකාශන සුලභතාව අතර සබඳතාව පවත්වා ගෙන යනු ලැබේ.[20]

ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධව 1980 දශකයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස IFLA සහ යුනෙස්කෝ මෙහෙයැවීම මත 1982 දී පැවැත්වුණු ප්‍රකාශනගත සුචිකරණය පිළිබඳ ජාත්‍යන්තර රැස්වීම (International Cataloguing in Publication Meeting) දැක්විය හැකි ය.[21]

මේ රැස්වීම 1977 පැවති ජාතික ග්‍රන්ථ නාමාවලි පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ දී යෝජිත ප්‍රකාශනගත සුචිකරණ වැඩ පිළිවෙළේ ඉදිරි ගමනක් ලෙස හැඳින්වීමට පිළිවන.

## ග්‍රන්ථ විඥාපන සේවා

ග්‍රන්ථ විඥාපන පාලනයෙන් අපේක්ෂිත අරමුණ ඉටු කරනු ලබන්නේ විවිධාකාරයේ ග්‍රන්ථ විඥාපන සේවාවන් මගිනි. ග්‍රන්ථ විඥාපන සේවා පුළුල් වශයෙන් කොටස් තුනකට බෙදා දැක්වීමට පිළිවන.

1. ඒකීය/ පුද්ගල මූලික ග්‍රන්ථ විඥාපන සේවා
2. ජාතික ග්‍රන්ථ විඥාපන සේවා
3. ජාත්‍යන්තර ග්‍රන්ථ විඥාපන සේවා වශයෙනි.

## ඒකීය/ පුද්ගල මූලික ග්‍රන්ථ විඥාපන සේවා

ඒ ඒ පුස්තකාල විසින් ස්වකීය එකතු සම්බන්ධව සම්පාදනය කරනු ලබන සුචි හා ග්‍රන්ථ නාමාවලි ආදිය ද පුද්ගලයන් විසින් තනි තනිව හෝ සහයෝගිතාවෙන් යුතුව සම්පාදන ය කරනු ලබන ග්‍රන්ථ නාමාවලි අනුක්‍රමණිකා ආදිය ද මේ ගණයට අයත් කළ හැකි ය. පුස්තකාල සුචිවල විශේෂතාව වන්නේ ඒවා බොහෝවිට ජාතික සීමාවන්ට හසු නො වීමයි. පුස්තකාල එකතුවෙහි ඇති සියලු ම ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ඇතුළත් කැරෙන බැවින් ඒවා එක්තරා ප්‍රමාණයකට ජාත්‍යන්තර ස්වරූපයක් උසුලයි. ඇතැම් විට පුස්තකාල ගණනාවක එකතු අළලා සම්පාදනය කැරෙන ඒකාබද්ධ සුචි බොහෝ දුරට ජාත්‍යන්තර ග්‍රන්ථ විඥාපන මෙවළම් සේ සැලකිය හැකි ය.

පුද්ගලයන් විසින් සම්පාදනය කරනු ග්‍රන්ථ නාමාවලි ග්‍රන්ථ විඥාපන පාලන ඉතිහාසයේ මුල් යුගයේ සිට ම ඉතා වැදගත් තැනක් ගනී. ජාතික ග්‍රන්ථ නාමාවලි ප්‍රභවය සම්බන්ධව පුද්ගල මූලික ග්‍රන්ථ විඥාපන සේවාවන්හි දායකත්වය කැපී පෙනේ.

බාර්නබි බර්නාඩ් ලින් ලොට් විසින් පවත්වා ගෙන යන ලද A Catalogue of all books, sermons and pamphlets (1714-1715), එඩ්වර්ඩ් කේව්ගේ Gentleman's magazine or Monthly intelligence (1731), රොබර්ට් වොට්ගේ The bibliotheca Britannica, විලියම් බෙන්ට්ගේ Monthly Literary advertiser (1802) ආදිය මෙබඳු ආරම්භක පුද්ගල ග්‍රන්ථ නාමාවලිවලට නිදසුන් ය.[22] ආචාර්ය ඉයන් ගුණතිලකගේ Bibliography of Ceylon කෘතිය ශ්‍රී ලංකාව සම්බන්ධ ඒක පුද්ගල ග්‍රන්ථ නාමාවලි අතර විශිෂ්ට ස්ථානයක් හිමි කර ගනී. පුද්ගල මූලික ග්‍රන්ථ විඥාපන සේවා විවිධ ස්වරූප උසුලනු පෙනේ. ඇතැම් ඒවා ජාතික ස්වභාවයක් ගන්නා අතර තවෙකක් කිසියම් විෂයකට සීමා විය හැකි ය.

## ජාතික ග්‍රන්ථ විඥාපන සේවා

ජාතික ආයතනයක් විසින්, එනම් බොහෝ විට ජාතික පුස්තකාලයක් විසින්, ජාතික ප්‍රකාශන අළලා සම්පාදනය කරනු ලබන ජාතික ග්‍රන්ථ නාමාවලි හා අනුක්‍රමණිකා ආදිය මේ ගණයට අයත් වේ. ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේ මුල් ගල වශයෙන් සැලකෙන්නේ ජාතික ග්‍රන්ථ නාමාවලිය යි. අඛණ්ඩව පළ කැරෙන ප්‍රවර්තන ජාතික ග්‍රන්ථ නාමවලි කල් ගත වන විට පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලි බවට පත් වේ. ජාතික ග්‍රන්ථ නාමාවලි හැරුණු විට ජාතික පුස්තකාලයක් විසින් වෙනත් අතිරේක ග්‍රන්ථ නාමාවලි හා අනුක්‍රමණිකා ද සම්පාදනය කරනු ලැබිය හැකි ය. එසේ ම ජාතික ඒකාබද්ධ සුචියක් සම්පාදනය හා නඩත්තු කිරීම ද ජ පුස්තකාලයකින් ඉටු කැරෙන ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවකි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් පළ කරනු ලබන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය, පූර්ව කාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය, ළමා ග්‍රන්ථ නාමාවලිය, ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය, ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව, ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව [23] ඉහත දක්වන ලද ආකාරයේ ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවනට නිදසුන් ය.

## ජාත්‍යන්තර ග්‍රන්ථ විඥාපන සේවා

ලෝකයේ ප්‍රධාන පුස්තකාල, විවිධ සංවිධාන, ආයතන, දත්ත පදනම් ආදිය විසින් සම්පාදනය කරනු ලබන, එක් රටක ප්‍රකාශනවලට පමණක් සීමා නො වූ ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා, සාර සංග්‍රහ ආදිය මේ ගණයට අයත් වේ.

ඇමරිකා එක්සත් ජනපදයේ කොංග්‍රස් පුස්තකාලය මගින් පළ කොට ඇති A Catalogue of books represented in Library of Congress printed cards; Library of Congress author catalog; National union catalog , බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලීය ප්‍රකාශනයක් වන General catalogue of printed books , බ්‍රිතාන්‍ය පුස්තකාලීය ප්‍රකාශනයක් වන The British Library general catalogue of printed books ආදි දැවැන්ත ප්‍රකාශන ජාත්‍යන්තර ආවරණයක් සහිත පුස්තකාල සුචිවලට නිදසුන් ය.

ජාතික සීමාවන් ඉක්මවා යන ග්‍රන්ථ විඥාපන සේවා අති විශාල සංඛ්‍යාවක් තිබේ. Ulrich's International periodicals directory; science citation index බඳු කෘති ද, OCLC ( On -Line Computer Library Center); DIALOG බඳු දත්ත පදනම් ද මෙහි ලා ප්‍රකට නිදසුන් ය.

## ග්‍රන්ථ විඥාපන පාලන ප්‍රමිති

ග්‍රන්ථ විඥාපන පාලන කාර්යය සාර්ථක වන්නේ ඒ පිළිබඳව සම්මත කර ගනු ලැබූ ප්‍රමිති මාලාවක් තිබේ නම් පමණි. ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය, අවසානයේ විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනයක් බවට පරිවර්තනය වන නිසා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිග්‍රාහිත ප්‍රමිති අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

ග්‍රන්ථ විඥාපන ප්‍රමිති [24] සම්පාදනය හා ප්‍රවර්ධනය සම්බන්ධව කටයුතු කරන ප්‍රධාන ජගත් ආයතන කිපයක් තිබේ. යුනෙස්කෝ ආයතනයේ පොදු විඥාපන වැඩ සටහන (Unesco General Information Programme ), IFLA විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ ජාත්‍යන්තර කාර්යාලය (IFLA International Office for UBC ) හා ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය, විශේෂයෙන් එහි 46 වැනි තාක්ෂණික කමිටුව (International Orgnization for Standardization , ISO Technical Committee 46( ISO/TC 46) මේ අතර ප්‍රමුඛත්වය උසුලයි.

ග්‍රන්ථ විඥාපන පාලන ප්‍රමිති ප්‍රධාන කොටස් හතරකට බෙදි ය හැකි ය.

1. කර්තෘත්වයට හෙවත් කෘතියේ බුද්ධිමය හෝ කලාත්මක අන්තර්ගතයේ වගකීමට අදාළ ප්‍රමිති: ශීර්ෂය පිළිබඳ ප්‍රමිති
2. ග්‍රන්ථ විස්තරය පිළිබඳ ප්‍රමිති
3. ජාත්‍යන්තර අංකන ක්‍රම පිළිබඳ ප්‍රමිති
4. විෂය එළඹුම පිළිබඳ ප්‍රමිති [25]

## ශීර්ෂ සම්පාදන ප්‍රමිති

සුචිකරණ නීති සංහිතාවේ දෙවැනි සංස්කරණය (AACR 2) හා එහි සංශෝධිත මුද්‍රණයන්හි දෙවැනි කොටසෙහි එන නීති (පරිච්ඡේද 21-26) මේ පිළිබඳව ප්‍රතිග්‍රාහිත ජාත්‍යන්තර ප්‍රමිතියක් ලෙස සැලකිය හැකි ය. මේ ප්‍රමිති බොහෝ කලක සිට සංවර්ධනය වෙමින් පැවති, 1961 පැරිසියේ පැවැත්වුණු සුචිකරණ මූලධර්ම පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ දී පළමු වරට සම්මත කර ගන්නා ලද ඒවා ය. එකී ප්‍රමිති AACR 2 නීති සංහිතාවේ දී තව දුරටත් සංශෝධනය වී තිබේ. මේ හැරෙන්නට IFLA ආයතනය මගින් පුද්ගල නාම සම්බන්ධව සම්පාදිත Names of persons: national usage for entry in catalogues කෘතිය ද, ආයතන නාම සම්බන්ධව රචා වෙරෝනා විසින් සම්පාදිත Corporate headings: their use in library catalogues and national bibliographies කෘතිය ද, IFLA ආයතනය විසින් ම සම්පාදිත Names of states: an authority list of language forms for cataloguing entries කෘතිය ද ශීර්ෂ සම්පාදනයට අදාළ ඇතැම් ප්‍රමිති වශයෙන් හැඳින්විය හැකි ය.

## ග්‍රන්ථ විස්තරය පිළිබඳ ප්‍රමිති

ප්‍රකාශිත කෘති සඳහා නිරවද්‍ය ග්‍රන්ථ විස්තර සම්පාදනය ග්‍රන්ථ විඥාපන පාලනයේ පළමු පියවර වේ. ග්‍රන්ථයක් හඳුනා ගැනීම සඳහා කුමන කරුණු විස්තර කළ යුතු ද, එසේ විස්තර කැරෙන කරුණුවල අනුක්‍රමය කුමක් ද, ඒ ඒ කරුණු අන්‍යොන්‍ය වශයෙන් වෙන් කොට දක්වන්නේ කෙසේද, බඳු මෙහි දී මතු වන ගැටලු නිරාකරණය සඳහාත්, ඒකීය ක්‍රමයක් අනුගමනය කිරීම සඳහාත් නිශ්චිත ප්‍රමිති අවශ්‍ය වේ.

ලෝකයේ බොහෝ රටවල ග්‍රන්ථ නාමාවලින්හි ඇතුළත් සංලේඛවල සමරූපිතාව සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විඥාපන විස්තරයක් බිහි කිරීමට දරන ලද ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස 1970 දශකයේ අග භාගය වන විට විවිධ ග්‍රන්ථ විඥාපන ප්‍රමිති එළි දැක්විණි. ISBD හෙවත් ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විඥාපන විස්තරය (International Standard Bibliographic Description ) යන පොදු නාමයෙන් හැඳින්වෙන එබඳු ප්‍රමිති කිහිපයක් යට දැක්වේ.

ISBD (M) (monographs) 1978 (සංශෝධිත)
ISBD (S) ( Serials) 1977
ISBD (CM) ( Cartographic Materials) 1977
ISBD (NBM) (Non-Book Materials) 1977
ISBD (A) ( Antiquarian) 1980
ISBD (PM) ( Printed Music) 1980

මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් නම් ඇංග්ලෝ ඇමරිකානු සුචිකරණ නීති සංහිතාවේ දෙවැනි සංස්කරණයේ දී සියලු ම පුස්තකාල ද්‍රව්‍ය ඒකාකාරයකින් විස්තර කළ යුතු යැ යි ගන්නා ලද තීරණය අනුව සියලු ම ද්‍රව්‍ය ආවරණය වන පරිදි ISBD (G) (General ) යනුවෙන් හැඳින්වෙන පොදු ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විඥාපන විස්තරයක් 1977 දී සම්මත කර ගන්නා ලද බව යි. AACR 2 නීති සංහිතාවේ පළමු කොටසේ එන විස්තරය පිළිබඳ නීති සැකසී ඇත්තේ මෙකී ISBD(G) ප්‍රමිතිය අනුව ය.

## ජාත්‍යන්තර අංකන ක්‍රම

ඒ ඒ ප්‍රකාශන නිශ්චිත ව හා කේවළ ව හඳුනා ගැනීම සඳහා සම්මත ජාත්‍යන්තර අංකන ක්‍රම භාවිත කරනු ලැබේ. මේ සම්බන්ධව දැනට භාවිත වන ප්‍රධාන ප්‍රමිති තුනකි. මුද්‍රිත ග්‍රන්ථ හඳුනා ගැනීම සඳහා භාවිත කැරෙන ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ අංකය (International Standard Book Number ) ( ISBN ), වාරික ප්‍රකාශන සඳහා යෙදෙන ජාත්‍යන්තර ප්‍රමිත මාලික අංකය(International Standard Serial Number ) (ISSN ), මුද්‍රිත සංගීත කෘති සඳහා යෙදෙන ජාත්‍යන්තර ප්‍රමිත මුද්‍රිත සංගීත අංකය (International Standard Printed Music Number (ISPMN ) යනුවෙනි.

## විෂය එළඹුම පිළිබඳ ප්‍රමිති

ප්‍රකාශනයන්හි අන්තර්ගත විෂය හඳුනා ගැනීම සඳහාත්, විෂයානුකූලව ප්‍රකාශන සංවිධානය සඳහාත් භාවිත කැරෙන විවිධ ග්‍රන්ථ වර්ගීකරණ ක්‍රම, අනුක්‍රමණිකා ක්‍රම හා පර්යාය පද කෝෂ මේ ගණයට අයත් වේ.

ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය, කොංග්‍රස්

පුස්තකාලීය වර්ගීකරණය, පරිරක්ෂිත සන්දර්භ අනුක්‍රමණිකා ක්‍රමය(Preseved Context Indexing System) (PRECIS), පරම්පරා රීතිය හෙවත් දාම අනුක්‍රමණිකා ක්‍රමය (Chain Indexing), පරිගණක උපකාරක විෂය අනුක්‍රමණිකා ක්‍රමය (Computer Aided Subject System) (Compass) හා විවිධාකාර පර්යාය පද කෝෂ (The-sauri) මෙහි ලා නිදසුන් ය.

ග්‍රන්ථ විඥාපන ප්‍රමිති ගැන සාකච්ඡා කිරීමේ දී ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය (ISO) මඟින්, පුස්තකාල හා ප්‍රලේඛන විද්‍යාවට අදාළ ප්‍රමිති තිහකට ආසන්න සංඛ්‍යාවක් සම්පාදනය කොට ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

## ග්‍රන්ථ විඥාපන පාලනයේ නව ප්‍රවණතා

ග්‍රන්ථ විඥාපන පාලනය හැම විට ම තත්කාලීන තාක්ෂණය හා බැඳුණක් වේ. සංකල්පාත්මක වශයෙන් සලකා බලන විට ග්‍රන්ථ විඥාපන පාලනය ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය හරහා විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය දක්වා ද, අවසාන වශයෙන් විශ්ව ප්‍රකාශන සුලභතා සංකල්පය දක්වා ද වර්ධනය වී තිබේ. මේ හැරෙන්නට සංකල්පාත්මක හෝ න්‍යායාත්මක වශයෙන් එහි නව ප්‍රවණතාවක් දක්නට නැත. එතකුදු වුවත් ග්‍රන්ථ විඥාපන පාලනයේ විධි ක්‍රම සම්බන්ධව, වත්මන් තාක්ෂණික සංවර්ධනයක් සමඟ හට ගත් නව ප්‍රවණතා රාශියක් තිබේ. ඒ සියල්ල පරිගණකාශ්‍රිත නවීන විඥාපන තාක්ෂණය හා සම්බන්ධ ය. මේවා (I) යන්ත්‍ර පාඨ්‍ය සුචිකරණය (Machine Readable Cataloguing) (MARC) (II) දත්ත පදනම් හා මාර්ග ගත සේවා (Data Bases and On-line Services) (III) අන්තර්ජාල සේවා (Internet Services) යන විස්තීර්ණ මාතෘකා යටතේ සලකා බැලිය හැකි ය.

## යන්ත්‍ර පාඨ්‍ය සුචිකරණය

MARC යන හැකිළුමෙන් හැඳින්වෙන යන්ත්‍ර පාඨ්‍ය සුචිකරණය හෝ සුචිය (Machine Readable Cataloguing or Catalogue) සැබවින් ම සුචිකරණ ක්‍රමයක් හෝ සුචියක් නොවේ. ඒ වූ කලී පරිගණකයක් මඟින් හැසිරවීම සඳහා (එනම් ප්‍රදර්ශනය, ගවේෂණය හා මුද්‍රණය) සුචි සංලේඛයක හෙවත් සුචි වාර්තාවක අන්තර්ගත එක් එක් කොටස වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම පිණිස ලේබල හෝ කේත යෙදීමේ ක්‍රමයකි.[26]

1965-1966 කාල පරිච්ඡේදයේ දී නියමු ව්‍යාපෘතියක් වශයෙන් කොංග්‍රස් පුස්තකාලය විසින් ආරම්භ කරන ලද MARC වැඩ පිළිවෙළ ශීඝ්‍රයෙන් ලොව සෙසු රටවලට ද ව්‍යාප්ත විය. මේ වන විට ලොව පුරා විවිධ රටවල MARC ආකෘති 20 කට අධික සංඛ්‍යාවක් බිහි වී තිබේ.

ග්‍රන්ථ විඥාපන දත්ත තේරීම, ගවේෂණය හා හුවමාරුව පහසු කරවන ක්‍රමයක් ලෙස MARC ක්‍රමය ග්‍රන්ථ විඥාපන පාලන ක්ෂේත්‍රයේ පෙරළියක් ඇති කරන්නට සමත් ව සිටී.

කෙසේ වෙතත් ජාත්‍යන්තර වශයෙන් ග්‍රන්ථ විඥාපන දත්ත හුවමාරුවේ දී එක් එක් රටවල MARC ආකෘති අතර පවත්නා වෙනස්කම් බාධාවක් බවට පත් වෙයි. මේ බාධකය ජය ගැනීම සඳහා IFLA සංවිධානයේ මැදිහත්වීමෙන් විශ්ව යන්ත්‍ර පාඨ්‍ය සුචිකරණ ක්‍රමයක් (Universal Machine Readable Cataloguing) (UNIMARC) සංවර්ධනය කිරීම ඇරඹිණි. UNIMARC හි අරමුණ වන්නේ එකිනෙකට වෙනස් MARC ආකෘති දෙකක් අතර අතරමැදියකු සේ ක්‍රියා කිරීම යි. ඒ අනුව එක් MARC ආකෘතියක් පළමුව UNIMARC ආකෘතියට පෙරළා අනතුරුව තමනට අභිමත වෙනත් MARC ආකෘතියට පෙරළා ගත හැකි ය.

IFLA සංවිධානය විසින් 1977 දී UNIMARC: Universal MARC format කෘතිය ද, 1980 දී එහි දෙවැනි සංස්කරණය ද, 1983 දී UNIMAC Hand-book කෘතිය ද, 1987 දී UNIMARC Manual කෘතිය ද, 1991 දී UNIMARC/ Authorities කෘතිය ද ප්‍රකාශයට පත් කරන ලදි.

ග්‍රන්ථ විඥාපන පාලන කටයුතු සඳහා සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍ය යොදා ගනු වෙනුවට MARC ක්‍රමය භාවිතයෙන් වාසි රැසක් සැලසේ. ඉතා කෙටි කාලයක් තුළ දී ග්‍රන්ථ විඥාපන දත්ත ජාතික සීමාවන් ඉක්මවා පතළ කර හැරීමට එමඟින් ඉඩ සැලසේ. මාර්ගගත සේවා ඔස්සේ ග්‍රන්ථ විඥාපන දත්ත පරිහරණයට ද ඉන් අවකාශ ලැබේ.

මෑත දශකද්වයේ දී ශීඝ්‍ර දියුණුවකට පත් වූ CD-ROM (Computer Disk-Read Only Memory) හෙවත් සංහිත තැටි තාක්ෂණය ද ග්‍රන්ථ විඥාපන පාලන විධි ක්‍රම අතර විප්ලවීය වෙනස්කම් හට ගන්වන්නට සමත්ව ඇත. ග්‍රන්ථ විඥාපන දත්ත අති විශාල ප්‍රමාණයක් සංහිත තැටියක ගබඩා කළ හැකි අතර, එය පරිගණකාධාරයෙන් පරිහරණය කළ හැකි ය. අප විසින් ඉහත දී සඳහන් කරන ලද නොයෙකුත් ග්‍රන්ථ විඥාපන සේවාවල දී සංහිත තැටි තාක්ෂණය බහුලව යොදා ගනු පෙනේ. ලෝකයේ ඇතැම් රටවල ජාතික ග්‍රන්ථ නාමාවලි තවදුරටත් මුද්‍රිත ග්‍රන්ථ ලෙස පළ නො කැරේ. ඒ සඳහා සංහිත තැටි යොදා ගැනේ. ඕස්ට්‍රේලියානු ජාතික ග්‍රන්ථ නාමාවලිය නිදසුනකි.

DIALOG බඳු දත්ත පදනම් විශාල වශයෙන් සංහිත තැටි පාදක ඒවාය. ගබඩාකරණය, හුවමාරුව, භාවිතය අතින් ඇති පහසුව නිසා සංහිත තැටි තාක්ෂණය ග්‍රන්ථ විඥාපන පාලන කටයුතු සඳහා වැඩි වශයෙන් යොදා ගැනීමේ ප්‍රවණතාවක් පවතී.

## දත්ත පදනම් හා මාර්ගගත සේවා

මේවා ද පරිගණක පාදක ග්‍රන්ථ විඥාපන සේවා වශයෙන් හැඳින්විය හැකි ය. ලෝකයේ හැම රටක ම පාහේ ජාතික වශයෙන් ද, ඇතැම් විට කලාපීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් ද දත්ත පදනම් හා මාර්ගගත විඥාපන සේවා බිහි වී තිබේ. ඉහත සඳහන් කරන ලද OCLC, DIALOG බඳු සේවා මෙහි ලා ප්‍රකට ජාත්‍යන්තර නිදසුන් ය. MARC සහ සංහිත තැටි තාක්ෂණය මෙබඳු සේවාවල කේන්ද්‍රීය කාර්ය භාරය ඉටු කරන බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

දත්ත පදනම් හා මාර්ග ගත සේවා ඇතැම් විට ( ආයතනයකට, එහි අනුග්‍රාහකයන්ට පමණක් සීමා විය හැකි ය. සාමාන්‍ය පුස්තකාලයක දක්නට ලැබෙන මාර්ග ගත පොදු ප්‍රවේශ සුචිය හෙවත් OPAC (On-line Public Access Catalogue) නිදසුනකි. ඇතැම් විට එබඳු සුචි ආයතනික සීමා ඉක්මවා ජාතික මට්ටමට දක්වා ද, ජාතික සීමා ඉක්මවා ජාත්‍යන්තර මට්ටමට දක්වා ද ව්‍යාප්ත කර තිබීමට පිළිවන. ලොව ප්‍රධාන ජාතික පුස්තකාල සුචි මෙසේ මාර්ගගත සුචි බවට පරිවර්තනය කොට තිබේ. කොංග්‍රස් පුස්තකාල සුචිය නිදසුනකි.

## අන්තර්ජාල සේවා

අන්තර්ජාල වර්ධනයක් සමඟ ලෝකයේ ග්‍රන්ථ විඥාපන සේවාවන්හි පෙර නුවූ විරූ ආකාරයේ ආකෘතික විපර්යාසයක් හට ගෙන තිබේ. පරිගණකාශ්‍රිතව සිදු කැරෙන විද්‍යුත් මාධ්‍ය ග්‍රන්ථ ප්‍රකාශනය නිසා සාම්ප්‍රදායික ස්වරූපයෙන් ග්‍රන්ථ විඥාපන පාලනයක් සිදු කිරීම අද බෙහෙවින් අසීරු කරුණක් බවට පත්ව ගොසිනි. අනෙක් අතට ග්‍රන්ථ විඥාපන පාලනය (Bibliographic Control) යන පද යෙදුම අන්තර්ජාල ගත තොරතුරු විෂයයෙහි අදාළ කර ගත හැකි ද යන ගැටලුව ද මතු වේ. ග්‍රන්ථ විඥාපන පාලන සංකල්පය

වර්ධනය වූයේ මිනිස් දැනුම අතින් ස්පර්ශ කළ හැකි හෙවත් ඇසට පෙනෙන මාධ්‍යවල (එනම් මැටි පුවරු, ශාක පත්‍ර, කඩදාසි, චලන චිත්‍රපට, කැසට් පට, සූක්ෂ්ම ස්වරූප ආදිය) වාර්තා කැරුණු වකවානුවල දී ය.

එහෙත් පරිගණකඩශ්‍රී විද්‍යුත් ප්‍රකාශනයේ දී වාර්තා ගත කැරෙන මාධ්‍යය හෙවත් බහලුව අදෘශ්‍යමානය; අස්පර්ශ්‍ය ය. එය පරිගණක තිරය තුළින් ම දර්ශනය කළ යුත්තකි. එහෙයින් අන්තර්ජාල ගත සහසු සංඛ්‍යාත තොරතුරු පරිහරණය හා ගවේෂණය සඳහා දැනට භාවිතයේ පවත්නා ග්‍රන්ථ විඥාපන පාලන විධි ක්‍රම හා ප්‍රමිති ප්‍රමාණවත් වන බවක් නො පෙනේ.

අන්තර්ජාල ගත සම්පත් සුචිකරණය සම්බන්ධව ප්‍රමිති ඇති කර ගැනීමට යම් යම් ප්‍රයත්න දරා තිබේ. OCLC මගින් සම්පාදිත Cataloguing Internet Resources: a manual and practical guide [27] මේ පිළිබඳ එක් නිදසුනකි.

අන්තර්ජාලීය තොරතුරු වෙත ප්‍රවේශය පහසු කිරීම පිණිස විවිධ ආයතන විසින් නිර්මාණය කරන ලද ගවේෂණ යන්ත්‍ර (Searh engines ) අන්තර්ජාලය තුළ ම තිබේ. දැනට මෙවැනි ගවේෂණ යන්ත්‍ර 2000 කට අධික ප්‍රමාණයක් ඇති අතර මේ විවිධත්වය නිසා ම අන්තර්ජාලගත තොරතුරු වෙත පිවිසීම හා ගවේෂණය බොහෝ විට අපේක්ෂිත ප්‍රතිඵල සාධනය නො කරන්නක් විය හැකි ය.

එහෙයින් නව ලෝකයේ ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධව වඩාත් කාලීන හා විධිමත් ප්‍රමිති හා උපාය මාර්ග සංවර්ධනය කර ගත යුතු අවස්ථාවකට අප එළඹ සිටින බව කිව යුතු ය. මෙහි දී පුස්තකාලවේදීන් විසින් දිගු කලක් මුළුල්ලේ සංවර්ධනය කරන ලද ප්‍රමිති හා ක්‍රම වේදයන්ගේ පමණක් නොව නවීන විඥාපන තාක්ෂණවේදීන් විසින් සංවර්ධිත ප්‍රමිති හා ක්‍රමවේදයන්ගේ සුසංයෝජනයෙන් වඩාත් හිතකර ප්‍රතිඵල ලබා ගත හැකි වනු ඇත.

## පාදක සටහන්


1. London: Clive Bingley,1975.p.7

2. Prospects for change in bibliographic control .edited by Bookstein,A, Fussler, H.H. and Schmierer, H.F. Chicago: University of Chicago press.1977.p.1

3. Gould,Sara and Watkins,Judy. International co-operation: the role of the IFLA OFFICES for UAP and international lending • an email sent to another [judy.watkins@bl.uk]

4. ග්‍රන්ථ විඥාපන පාලනය හෙවත් (Bibliographic Control ) යන පදය පිළිබඳව මුල්වරට පැහැදිලි අර්ථ නිරූපණයක් ඉදිරිපත් කරන ලද්දේ වර්ෂ 1950 දී යුනෙස්කෝව හා කොංග්‍රස් පුස්තකාලය එක්ව කරන ලද ග්‍රන්ථ විඥාපන සමීක්ෂණයේ දී ය. එහි මෙසේ දැක්වේ: "Bibliographic Control is defined to mean the mastery over written and published records which is provided by and for the purposes of bibliography. (Bibliographic Control ) is synonymous with" effective access through bibliographies". Thus a reference to " bibliographic control in medicine" means " effective access through bibliographies to sources of medical information".) Bibliographical Services : their present state and possibilities of improvement: report prepared as a working paper for an International Conference on Bibliography. Washington: Library of Congress,1950,p.1

5. මේ පිළිබඳ ප්‍රාමාණික විස්තරයක් සඳහා බලන්න: Feather,John. The information society: a study of continty and change , 2nd ed. London: Library Association,1998,Chapter 01.

6. Linder, LeRoy Harold. The rise of current complete national bibliography . New York: Scarecrow,1959,p.43

7. Van Hoesen, Henry Bartlet. Bibliography: practical. enumerative. historical: an introductory manual . New York: Burt Franklin,1928,p 211

8. මේ පිළිබඳ විස්තර සඳහා බලන්න: Ranasinghe, Piyasasa. Sri Lanka national bibliography: a historical and critical study ( M.Lib.Thesis. University of New South Wales,1994), pp. 14-18

9. Campbell,Frank. The theory of national and international bibliography . London: Library Bureau, 1896,p.139.

10. Encyclopaedia of Librarianship . edited by Thomas Landau.2 nd ed. London: Bowes & Bowes. 1961. see under International Federation for Documentation

11. United Nations treaty series : treaties and international agreements registered or filed and recorded with the secretariat of the United Nations . [New York]: United Nations, 1947. vol.4. p 247.

12. American Library Assoiciation . Conference on International, Cultural, Educational and Scientific Exchange . Princeton University. 1946,Chicago: ALA,1947. pp.XV-XVI

13. පාදක සටහන් අංක 4 බලන්න.

14. Main conclusions and recommendations in symposium on National Libraries in Europe . In National Libraries: their problems and prospects, Paris: Unesco,1960,pp.112-113

15. Working Group on the Coordination of Cataloguing principles. Report on anonyma and corporate authorship. In. Libri 6 (3), 1956,pp.271-297.

16. Chaplin.A.H. and Anderson, Dorothy. Report of the International Meeting of Cataloguing Experts . Copenhagen,1969.In. Libri 20 (2),1970,pp.115-116.

17. Anderson,Dorothy. Universal Bibliographic Control .In Encyclopedia of library and information science /edited by Allen Kent.New York: Maecel Dekker, 1984, V.37. supplement 2,pp.366-401

18. Anderson, Dorothy. Universal Bibliographic Control: a long-term policy, a plan for action .Munchen: K.G.Saur, 1974, pp.11-12

19. Anderson, Dorothy. Univerasl Bibliographic Control. P.371

20. Proceedings of IFLA World-wide seminar. May 31- June 5.1976. Seoul: Korean Library Association, 1976


21. International Cataloguing- in-Publication Meeting . Ottawa, 1982. In. International Cataloguing, 1(4).1982.pp. 39-40

22. Ranasinghe, Piyadasa.pp.14-15


23. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ග්‍රන්ථ විඥාපන සේවා පිළිබඳ කෙටි විස්තරයක් සඳහා බලන්න. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ග්‍රන්ථ විඥාපන කටයුතු .කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, [ 1998]


(18 වන පිටුවට)


# DIRECTORIES
## published by the
# NATIONAL LIBRARY OF SRI LANKA





Rs. 100.00




Rs. 100.00




Rs. 225.00




Rs. 200.00




Rs. 100.00

**Inquiries**
**National Library Bookshop**
**14, Independence Avenue, Colombo 07.**

# நூலக முகாமைத்துவ முறைமையும் தரவுத் தளமும்

கிருபா செல்லத்துரை
உதவி நூலகர் - திறந்த பல்கலைக்கழகம்

## அறிமுகம்

நாம் வாழும் காலம் தகவற் காலம் (Information Age). நூலகங்களில் வாசகர்களின் தேவைக்கு முன்னுரிமை வழங்கப்படும் காலம். இத் தகவல் காலத்தில் கணனி தொலைத் தொடர்புகளில் ஏற்பட்ட தொழில்நுட்ப வளர்ச்சி, சமுதாயத்தின் சகல மட்டத்திலும் அநேக தொழிற்பாடுகளை துரிதமாகவும் இலகுவாகவும் ஆற்றக்கூடிய வண்ணம் பாரிய மாற்றத்தைக் கொண்டு வந்துள்ளன. இதற்கு நூலகங்கள் விதிவிலக்கல்ல

நூகலகர்களின் கடமைகளுள் ஒன்று நூலகங்களில் உள்ள சேகரிப்பை வாசகர்கள் தமக்கு வேண்டியதை இலகுவான முறையில் கண்டு கொள்ளக் கூடிய வண்ணம் ஒழுங்குபடுத்துவதாகும். கடந்த நூற்றாண்டின் கடைசிப் பகுதி முதல் இதற்கென உழைத்த நூலகர்கள் பலர். அவற்றின் பலாபலனே இன்று நாம் பயன்படுத்தும் AACR2 எனும் பட்டியலாக்கல் விதி, UDC, DDC போன்ற பகுப்பாக்கத் திட்டங்கள், KWIC, KWOC போன்ற சுட்டியலாக்கல் முறைகள் மற்றும் பொருளை (Subject) இலகுவாகக் கண்டு கொள்ள உதவும் Thesaurus போன்ற மூலங்களாகும். இவை சர்வதேசரீதியில் பட்டியலாக்கத்திலும் பகுப்பாக்கத்திலும் ஒற்றுமையை பேணுவதுடன், எந்தவொரு நூலக ஆவணத்தையும் எளிதாகவோ அல்லது முழு விபரத்துடனோ காண்பிப்பதற்கு ஏற்றவாறு ஒழுங்குபடுத்தப்பட்டுள்ளன.

எனினும் ஒவ்வொரு வருடமும் வெளிவரும் நூல்களினதும் மற்றைய ஊடகங்களில் வரும் நூலக ஆவணங்களினதும் எண்ணிக்கை லட்சக் கணக்கில் அதிகரித்த வண்ணம் உள்ளன. அதனால் மரபுரீதியான பட்டியலாக்கல், பகுப்பாக்கல், சுட்டியலாக்கல் முறைகள், வேண்டியதை மீளப் பெறல் போன்ற செய்கைகளை துரிதமாக ஆற்ற இயலாத ஒரு நிலை உருவாகியது. இதை நிவர்த்தி செய்யக் கூடிய சாதனமாக கணனிகளினதும் தரவுத்தள முகாமைத்துவ நிர்வாக முறையினதும் பயன்பாடு விளங்குகின்றது.

## தரவுத் தளம்

ஒரு குறிப்பிட்ட விடயத்தை முற்றாக விளங்கக் கூடியவாறு எந்தெந்த சிறப்பியல்புகளின் சார்பில் அதை எடுத்துரைக்க முடியுமோ அவை தரவுத் தளத்தின் புலங்கள் (Fields) எனப்படும்.

அவ்விடயம் பற்றிய ஒரு மூலத்தின் (one item) முழுத்தரவுகளும் ஒரு பதிவு (Record) எனப்படும்.

ஒவ்வொரு பதிவையும் தனித்து இனம் காண (Uniquely identify) ஒரு புலமாவது (Field) இருப்பது சிறந்தது. அந்த புலம் (Unique identifier) அத் தரவுத் தளத்தின் முதன்மை மூலம் (Primary key) எனப்படும்.

உ+ம் - ஒரு நூற்பட்டியலில் இருந்து சில நூல்களின் விபரத்தை பார்ப்போம்.

| தலைப்பு | ஆக்கியோன் | வெளியீடு | ISBN | வெளியீட்டு வருடம் |
|---|---|---|---|---|
| பொருளாதாரம் | அருண்குமார், வீ | திருநகர்: முல்லை வெளியீடு | 81-7533-055-4 | 1997 |
| பொருளாதாரம் | பிரசாத், கே.என். | " " | 81-85880-74-3 | 1998 |
| கிராமப்புறங்களில் கைத்தொழில் வளர்ச்சி | கல்பனா, சீ. | " " | 81-7533-004-X | 1995 |
| நீர்ப்பாசன விரிவாக்க முறைகள் | கல்பனா, சீ. | " " | 81-7533-024-4 | 1998 |

ஒரு தலைப்பில் இரண்டுக்கு மேற்பட்ட நூல்கள் இருக்கலாம். ஒரு ஆசிரியரினால் ஒன்றுக்கு மேற்பட்ட நூல்கள் எழுதப்படலாம். ஆனால் ஒரு புத்தகத்திற்கு ஒரு சேர்ப்பு எண் மட்டுமே இருக்கும். ஒரு ISBN, ஒரு நூலையே குறிக்கும். எல்லா நூல்களுக்கும் ISBN இல்லாத காரணத்தால் சேர்ப்பு எண்ணை ஒரு முதன்மை மூலமாக கொள்ளலாம். ஆகவே நூலக பட்டியலின் தரவுத் தளத்திற்கு சேர்ப்பு எண் என்ற புலம் (Field) ஒரு சிறந்த முதன்மை மூலமாகும்.மேலும் ஒரு புத்தகம் உசாத்துணைக்கோ, இரவல் வழங்கலுக்கோ உரியது எனக் குறிக்க

வேண்டும். ஒரு ஆக்கம் நூலக வடிவில் இல்லாவிடில் வேறு எந்த ஊடகத்தில் உள்ளது (CD-Rom, கட்புல - செவிப்புல), நூலின் பதிப்பு பக்கங்கள், வெளியீட்டு இடம், வகுப்பு எண், மூலப் பொருள் (Key Word) சேர்ப்பு எண், பிரதிகளின் எண்ணிக்கை போன்ற சகல விபரங்களையும், நூலக கருமங்களை திறலுடன் ஆற்ற வேண்டியதற்கான சகல விடயங்களையும் அடக்கியதான புலங்களைக் கொண்டு (Fields) தரவுத்தளம் அமைய வேண்டும்.

## தரவுத்தளக் கட்டமைப்பு

தரவுகளைக் களஞ்சியப்படுத்தும் போது ஒவ்வொரு புலமும் (Field) அதி கூடியது எவ்வளவு இடத்தை எடுக்கும், அதன் தன்மை (முற்றாக எழுத்துக்களைக் கொண்டதா, முற்றாக எண்களைக் கொண்டதா அல்லது இவை இரண்டும் சேர்ந்ததா, திகதியா என்பன) அது தர்க்க மூலமா (Logical Field ) எனவும் குறித்துக் கொள்ளலாம்.

உ+ம் - நூலக நூற் பட்டியல் ஒன்றின் தரவுத் தளத்தின் புலங்களையும் அவற்றின் கட்டமைப்பையும் பார்ப்போம்.


| | புலம் (Field) | நீளம் (Character Length) | தன்மை (Type) |
|---|---|---|---|
| 1. | பட்டியலாக்கல் நிலை (Bibliographic Status) | 1 | A |
| 2. | பதிவுத் தன்மை (Record Type) | 2 | A |
| 3. | மொழி | 3 | A |
| 4. | தலைப்பு | 200 | A |
| 5. | ஆக்கியோன் | 30 | A |
| 6. | வெளியீட்டாளர் | 30 | A |
| 7. | வெளியீட்டு இடம் | 20 | A |
| 8. | பதிப்பு | 10 | A |
| 9. | வகுப்பு எண் | 20 | A |
| 10. | சேர்ப்பு எண் | 6 | N |
| 11. | ஓடர் இலக்கம் | 12 | A |
| 12. | ஓடர் திகதி | 9 | D |
| 13. | பக்கங்கள் | 10 | A |
| 14. | பிரதிகளின் எண்ணிக்கை | 2 | A |
| 15. | மூலப் பொருள் (Key word) | 30 | A |
| 16. | சுருக்கம் | 250 | A |
| 17. | குறிப்பு | 50 | A |
| 18. | பதிவுத் திகதி | 91 | D |
| 19. | பதிந்தவர் | 3 | A |
| | | 9 | D |

இப் புலங்கள் பற்றி நூலக தேவைகளுக்கு வேண்டிய தரவை களஞ்சியப்படுத்த போதுமானவை.

## தன்னியக்க தகவல் முறைமை

பாவனையாளர்களின் தேவைக்கேற்ப தரவுகளை ஏற்ற இடங்களில் கூட்டம் கூட்டமாக களஞ்சியப்படுத்தவும், வேண்டிய இடத்திற்கு அவற்றை கொண்டு செல்லவும் உதவும் தொகுதியாக இதை வரையறுக்கலாம்.

உ+ம் : நூலக இரவல் வழங்கல் சேவையை எடுத்தால், வெவ்வேறாக களஞ்சியப்படுத்தப்பட்டுள்ள வாசகர் விபரம்,நூற்பட்டியல் விபரம் என்பவை கரும பீடத்தில் சேவையாற்றும் இரவல் வழங்குபவருக்கு அனுப்பப்படவேண்டும்.இரவல் வழங்கிய பின் வாசகர் அங்கத்துவ இலக்கம், நூலின் சேர்ப்பு எண், இரவல் வழங்கிய திகதி, மீளக் கொடுக்க வேண்டிய திகதி போன்ற விபரங்கள் வேறு இடத்தில் களஞ்சியப்படுத்த வேண்டும்.




## நூலக முகாமைத்துவ தகவல் முறைமை

நூலகத்தின் நூலீட்டல், பட்டியலாக்கல், இரவல் வழங்கல் ஆகிய மூன்றையும் ஒருங்கிணைத்து நிர்வகிக்கக் கூடியதாக அமையும் தகவல் முறைமை, முகாமைத்துவ தகவல் முறைமை எனப்படும்.

## நூலக முகாமைத்துவ முறைமையை தெரிவு செய்தல்


எல்லா நூலகங்களினதும் சேவைகள் ஒன்றாக இருந்தாலும் ஒவ்வொன்றினதும் நோக்கங்கள், ஆற்றும் கருமங்கள் என்பன வேறுபடும்.இதன் காரணமாக 70,80 களில் வளர்முக நாடுகளில் அநேக நூலகங்கள் தத்தமது தேவைகள் அடங்கிய தன்னியக்க தகவல் முறைமையை(Automated Information System) தாமே அமைத்துக் கொண்டனர்.

90 களில் ஏற்பட்ட தகவல் தொழில் நுட்ப முன்னேற்றம் தரமான எல்லா சேவைகளையும் உள்ளடக்கக் கூடிய மென்பாண்டங்களை (Software) வர்த்தக ரீதியில் உருவாக்க உதவின. எனவே

கணனிகளை பயன்படுத்துவதில் முக்கியமாக நூலகர்கள் கருத்தில் கொள்ள வேண்டிய விடயம் எமது நூலகத்தின் தேவையான கருமங்களை நிர்வாகிக்கக் கூடிய ஒரு முகாமைத்துவ தகவல் முறைமையை அமைத்தல் அல்லது அவ்வாறான முகாமைத்துவ முறைமையை கண்டு கொள்வதாகும்.

உ+ம் - நூல் இரவல் வழங்கும் சேவையை எடுத்தால், வாசகர்களுக்கு வழங்கும் அங்கத்துவ அட்டைகளின் எண்ணிக்கை, ஏற்ற நேரத்தில் புத்தகத்தை திருப்பிக் கொடுக்காவிடில் செலுத்த வேண்டிய அபராதம் போன்றவை எல்லா நூலகங்களிலும் ஒரே மாதிரியாக இருப்பதில்லை. தரமான (Starndard) வர்த்தகரீதியான முகாமைத்து முறைமைகள் இவற்றை கருத்திற் கொண்டே ஒவ்வொரு நூலகங்களுக்கும் ஏற்றவாறு தேவைப்படும் இடங்களில் மாற்றங்களை செய்யக் கூடிய வசதிகளை (Options) ஏற்படுத்தி வைத்திருக்கின்றன.

எந்தவொரு மென்பாண்டத்தை (Software development) உருவாக்குவதிலும் அடிப்படையாக மேற் கொள்ளும் படிகளை அறிந்திருப்பது பயனுள்ளதாகும். அதில் ஒரு வழிமுறை தொகுதியின் வாழ்க்கைசக்கர முறை (System's life cycle ) எனப்படும்.




இது சக்ரவடிவில் உள்ளதன் காரணம் மீண்டும் மீண்டும், திருத்தங்களைச் செய்யவோ, புதிய தொழிற்பாடுகளைச் சேர்க்க இடம் உண்டு என்பதனாலாகும். நூலக சேவைக்கான தொகுதியை அடிப்படையாகக் கொண்டு இப்படிகளை விளங்கிக் கொள்ளலாம்.

## 1.Feasiblity study

கணனிமயப்படுத்தப்பட வேண்டியவை எவை, அவற்றைத் தற்போது (Manually) எவ்வாறு மேற்கொள்கின்றனர். எவ்வாறு ஒவ்வொரு பகுதியிலிருந்தும் தகவல்கள் வேறு இடத்துக்கு கொண்டு செல்லப்படுகின்றன போன்ற விபரங்களை தொகுதி பகுப்பாய்வாளர் திரட்டுவார். ( System Analyst)


உ+ம் - எவ்வாறு தரவுக் கட்டளைகளை அனுப்பி புதிய நூல்களையும் , ஆவணங்களையும் கொள்வனவு செய்வது, அதற்கு பரிமாற வேண்டிய கடிதங்கள் வழங்குபவர், வெளியீட்டாளர்கள், பற்றிய விபரங்கள் பணத்தை எவ்வாறு செலுத்துவது போன்றவை பின் நூற் பட்டியல் எவ்வாறு களஞ்சியமாக்கப்படுகின்றது. வாசகர்கள் தேடுதலை மேற்கொள்வதற்கும், வாசகர்களுக்கு இரவல் வழங்கக் கூடியவாறு எப்படி ஒழுங்கு படுத்துதல் போன்றவை.

## 2. தொகுதிப் பகுப்பாய்வு (System Analysis)


திரட்டிய தகவல்களிலிருந்து முழுத் தொழிற்பாடுகள் சம்பந்தமாக என்னென்ன தரவுத்தளங்களை அமைக்க வேண்டும் என கண்டு பிடிக்க வேண்டும். (Data modelling) பின்பு ஒவ்வொரு கருமத்தையும் ஆற்ற எத் தரவுக் களஞ்சியங்களிலிருந்து தகவல்கள் எவ்விடத்திற்குச் செல்ல வேண்டும் என்பது பற்றிய ஆராய்வுகளை நடத்துவதுடன் அவற்றைத் தெளிவாக விளங்கக் கூடிய வண்ணம் படமாகவும் அமைக்க வேண்டும் .

உ+ம்- நூலகத் தொகுதியில் அடிப்படைத் தேவையாக தரவுத் தளங்கள் ஒன்றுடனொன்று தொடர்புடையவை ஆகும்.

### தரவுத் தள மாதிரி (Data Model)




### தரவுப் பாய்வு (Data flow Diagram) (உ+ம்) - (Ordering) ஈட்டல்



## தொகுப்பு வடிவம் (System Design)

இதில் வெவ்வேறான தெரிவுப் பட்டியலை (Menu) தொழிற்பாடுகளை விளங்கக் கூடிய வண்ணம் அமைப்பர். தெளிவாக இருக்க எவ்வாறு தொழிற்பாடு களை ஒன்றன்பின் ஒன்றாக அமைக்கலாம் அல்லது பிரித்து வைக்கலாம். தரவுகளை உள்ளீடு செய்ய எவ்வாறான Work sheet, நாம் நடைமுறையில் பாவிக் கும் கடிதங்களின் மாதிரி, அறிக்கைகள் என்பவை எவ்வாறு இருக்க வேண்டும், எப்படி அவற்றை வேண்டிய இடங்களில் சேர்ப்பது போன்றவை இங்கு ஆராயப்படும். மேலும் என்ன செயலொழுங்கு மொழியியல் (Programing Language) அல்லது முகா மைத்துவ முறைமையை (Data base management system) பயன்படுத்தி அமைக்கலாம் என்ன கடின பதனம் தேவை போன்றவை இங்கு தீர்மானிக் கப்படும்.

உ+ம் - இரவல் வழங்கலை எடுத்தால் அதன் முதல் தெரிவு பட்டியல் (Main menu) கீழ்க் காட்டப்பட்டுள்ளவாறு கரும பீட கருமங்களின் சார்பில் அமைந்திருக்கலாம்

**Circulation**

Main menu

1. Members
2. Issues
3. Returns
4. Renewals
5. Reservation
6. Reminders
7. Inquiries
8. Statistics
9. Reindex
10. exit

1. members க்குரிய sub menu பின்வருமாறு அமையலாம்.

1. Add new members - புதிய அங்கத்தவர்
2. Amend members - ஏற்கனவே உள்ளவர்கள்
3. Total No. members - முழு அங்கத்தினர்
4. member search by name - பெயரில் இருந்து அங்கத் தவரைக் கண்டு கொள்ளல்.
5. Delete - அங்கத்தவரை அகற்றல்

2. Issue க்குரிய Sub menu

1. Make an Issue - ஒரு நூலை இரவல் வழங்கல்
2. Display Issues - அங்கத்தவரால் இரவல் வழங்கியுள்ள நூல்கள்

7. Inquries க்குரிய sub menu

1. By Author - ஆக்கியோர் மூலம் நூலை அறிதல்
2. By Title - தலைப்பு மூலம் வேண்டிய நூல் விபரம்
3. By Accession - சேர்ப்பு எண் மூலம் அதை யாராவது ஏற்கனவே இரவல் கொண்டார்களா இல்லையா என அறிதல்.

மேலும் உ+ம் -

Reminder notice எப்படி இருக்க வேண்டும் என்பன எல்லாம் இங்கு காட்டப்படும்.

member Name : member No.
Reminder No : 1st Dept :
Date :

Please return the following books immediately if you have not returned them

Title Account No •• Due Date
-----
-----

பின்பு அவை தொகுதியாக செயலொழுங்காற்றிய பின் சோதித்துப் பார்க்கப்படும்.

## புள்ளி விபரங்களை எளிதாக காணமுடியும்

வாசகர்களின் தேவை என்ன, எப்படியான நூல்களை இரவல் பெறுகின்றனர், ஒதுக்கல் செய் கின்றனர் எத்துறை சார் நூல்கள், எவரது நூல்களைப் பற்றி தேடுதலை மேற் கொள்கின்றனர், போன்ற விபரங் கள். அடுத்த வருடத்தில் நூல்களின் ஈட்டல்களுக்கு நல்ல ஒரு வழிகாட்டியாகும். நூலகத்தில் தற்போதுள்ள சேகரிப்பு விபரத்தை வகுப்பு எண்களின் சார்பில் தெளிவாகக் காணலாம்.

உ+ம்- எப்படியான நூல்களை இரவல் பெற்றார்கள் என அட்டவணைப்படுத்தலாம்.

உ+ம்- 01/06/1997 முதல் 01/07/1997 வரை அதாவது ஆனி மாதம் இரவல் வழங்கிய நூல்களை வகுப்பெண்களின் சார்பிலும், அவற்றின் வெளியீட்டு வருடம் சார்பிலும் பின்வருமாறு எடுத்துரைக்கலாம்.

| வகுப்பெண் | நூல்களின் எண்ணிக்கை | | | | |
|---|---|---|---|---|---|
| | 80 | 80-85 | 85-90 | 90-95 | 95 |
| 0-100<br>100-200<br>200-300<br><br>900-999.9 | | | | | |
| மொத்தம் | | | | | |

* ஒரு கல்வி சார் நூலகத்தில் எந்த துறையிலுள்ள வாசகர்கள் இவ்வாறு இரவல் வாங்கினார்கள் எனக் கண்டு கொள்ளலாம்.

* நாம் ஓடர் பண்ணிய நூல்களில் எவ்வளவு அந்த வருடத்தின் இறுதியில் வந்து சேர்ந்தன போன்ற விபரங்கள்.

* கடந்த வருடத்தில் கொள்வனவு செய்யப்பட்ட நூல்கள் இவ் வருடம் எத்தனை தடவை நுகரப் பட்டன எப்படியான புது நூல்களுக்கு கிராக்கி உண்டென அறிதல்.

## இலங்கையில் நூலக முகாமைத்துவ முறைமை

1. இலங்கையில் 90 களின் ஆரம்ப கால முதல் அநேக நூலகங்களாலும் வேறு ஸ்தாபனங்களாலும் பயன்படுத்தப்படும் தரவுத்தள முகாமைத்துவ தொகுதி (DBMS) CDS/ISIS ஆகும். இது UNESCO வினால் இலவசமாக வளர்ந்துவரும் நாடுகளுக்கு கொடுக் கப்பட்டதாகும். இது உண்மையில் ஒரு தரவுத் தளத் திலிருந்து தகவலை மீளப்பெற பயன்படும் தகவல் முறையாகும். அநேகமாக இதனை நூற்பட்டி யலாக்கத்துக்கே பயன்படுத்துகின்றனர். சிலர் இரவல் வழங்கலுக்கும், தரவுக் கட்டளைகளை அமைத்து நூல்களை ஈட்டவும் பயன்படுத்துகின்றனர். எனினும் ஒருங்கிணைந்து எல்லாவற்றையும் மேற்கொள்ளும் ஒரு தொகுதியாக அமைப்பதில் சிரமங்கள் இருப்பதால் அதை அவ்வாறான ஒரு Intergrated System ஆக இலங்கையில் இன்னும் பாவிக்கவில்லை .ஆனால் இந்தியாவிலும், கனடா, தாய்லாந்து போன்ற நாடு களில் அதன் செயலொழுங்கு மொழியான பாஸ்கல் மொழியைப் பயன்படுத்தி ஒரு தரமான ஒரு முகாமைத் துவ முறைமையாக அமைத்துள்ளார்.

2. Informix எனும் தரவுத்தள முகாமைத்துவ முறைமையை (DBMS) பயன்படுத்தி இரவல் வழங் கலுக்கு ஒரு தகவல் முறைமையை தாமாகவே தமது தேவைகளுக்கமைய அமைத்துள்ளது, CISR என்ற நிறுவனம்.

3. IIMIஎன்ற நிறுவனம் Inmagic என்ற வர்த்தக ரீதியாக தயாரிக்கப்பட்ட முகாமைத்துவ முறைமையை பயன்படுத்துகின்றார்கள்.

4. British Council, Libsys எனும் தரமான வர்த்தக ரீதியாக அமைக்கப்பட்ட முகாமைத்துவ முறைமையை பயன்படுத்துகின்றனர். இலங்கையில் முதன் முதலாக ஒரு முற்றான முகாமைத்துவ முறை மையைப் பயன்படுத்தியவர்கள் இவர்களே. இங்கு துரித மாக ISBN ஐ அல்லது புத்தக Id ஐ வாசிக்கக் கூடியதாக நூல்களுக்கு Bar Coding செய்ததுடன் Bar code reader மூலம் இலகுவாக இவற்றை வாசித்து துரிதமாக நூல்களை வழங்க முடிகிறது.

12 වන පිටුවෙන්

24. **ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති පිළිබඳව (1976 දක්වා) විස්තරයක් සඳහා බලන්න**: Standardization activitics of concern to libraries and national bibliographies: an outline of current practices, projects and publications . Compiled by IFLA
International Office for UBC,London: IFLA committee on cataloguing,1976

25. Anderson,Dorothy.Universal Bibliograhic Control,p.380

26. UNIMARC: an introduction . Available at: http://ifla.org/VI/3?p/1996-1/unimarc.htm !

27. Cataloguing Internet resources: a manual and practical guide .edited by N.B. Olson.2 nd ed. 1997. Available at: http://www.purl.org/oclc/cataloguing-internet


පුස්තකාල සඳහා ලිපි ද්‍රව්‍ය සහ උපකරණ

ලිපි ද්‍රව්‍ය

පාඨක බලපත්‍ර
සූචි පත්‍රිකා
පොත් තුන්ඩු
දින පත්‍රිකා
පොත් සාක්කු
නියමු ලේබල්
පරිග්‍රහණ ලේඛන (පිටු 150)
පරිග්‍රහණ ලේඛන (පිටු 300)
සාමාජික අයදුම් පත්
(සිංහල, දෙමළ, ඉංග්‍රීසි)


ජාතික පුස්තකාල පොත් හල
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14
නිදහස් මාවත
කොළඹ 07

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
# මගින් ප්‍රකාශිත නවතම පුස්තකාල විද්‍යා ප්‍රකාශන




පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රධානතම ජාත්‍යන්තර සංවිධානය වන අන්තර්ජාතික පුස්තාකාල සංගම් සංවිධානය (ඉෆ්ලා) මගින් පළ කරන ලද Principles for the preservation and conservation of library materials කෘතියේ පරිවර්තනයකි

පරිවර්තනය - ධනපාල ගුණසේකර
මිල - රු. 50



එක්සත් රාජධානියේ බර්මින්හැම් බහුතාක්ෂණික ආයතනයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වන ශීලා රායි විසින් රචිත කෘතියක පරිවර්තනයකි. ළමා පුස්තකාලයක් සංවිධානය කිරීමට අදාළ සියලු තොරතුරු අඩංගු කෘතියකි

පරිවර්තනය - ජේ. ඩී. අමරසිරි
මිල රු. 90/-




This book contains information on automating circulation control which is a tailor - made application of the CDS/ ISIS Software. It will help readers in understanding the automation of the circulation process.

Price - Rs. 125/-

**විමසීම**
ජාතික පුස්තකාල පොත්හල
14, නිදහස් මාවත
කොළඹ 07

# තොරතුරු සමාජය

**යූ. පී. අලහකෝන්**
**සහකාර පුස්තකාලයාධිපති**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය**

ලෝකයේ සියලු සමාජ එළඹෙන 21 වන සියවස හමුවේ නන්විධ විපර්යාසයන්ට භාජනය වෙමින් පවතී. එකිනෙකට වෙනස් ලක්ෂණවලින් සමන්විත සමාජ තුළ ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ දේශපාලන ක්ෂේත්‍රයන්හි ප්‍රගමනය උදෙසා තොරතුරුවල වැදගත්කම වර්ධනය වීම මෙම විපර්යාසයන් අතරින් කැපී පෙනේ. මෙම තත්ත්වය රටවල භූගෝලීය වපසරිය, සංවර්ධිත මට්ටම් හෝ දේශපාලනික මතවාද පිළිබඳ සැලකීමක් නොමැතිව සෑම රටකට ම පොදු ලක්ෂණයක් ලෙසින් දෘෂ්‍යමාන වේ. මිලියන 2.5 ක ජනගහණයකින් යුත් සිංගප්පූරුවේ සිදු වන විපර්යාසය මිලියන 125 ක ජනතාවක් වෙසෙන ජපානයේ සිදු වන විපර්යාසයට සමාන ය. තායිලන්තය වැනි දියුණු වෙමින් පවතින රටවල් එක්සත් රාජධානිය හා ප්‍රංශය වැනි රටවලට සමාන ආකාරයෙන් තොරතුරු ආශ්‍රිත සමාජ හා ආර්ථික ක්‍රම කරා පියමං කරති. උතුරු ඇමෙරිකාව වැනි ධනේෂ්වර රාජ්‍යයන් චීනය හා වියට්නාමය වැනි කොමියුනිස්ට් රාජ්‍ය හා එක්ව තොරතුරු සමාජ ගොඩ නැංවීමේ ඉලක්කය සපුරාලීමට ප්‍රයත්න දරනු ලැබේ.

## තොරතුරු සමාජයක ලක්ෂණ

තොරතුරු සමාජය ප්‍රධාන ලක්ෂණ තුනකින් සමන්විත වේ.

(1) ආර්ථික සම්පතක් ලෙස තොරතුරු භාවිත කිරීම. බොහෝ සංවිධාන ඒවායේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු වැඩි වැඩියෙන් උපයෝගී කර ගනු ලබයි. රටවල සමස්ථ ආර්ථික වර්ධනය උදෙසා තොරතුරු ආශ්‍රිත සංවිධාන බිහි වීමේ ප්‍රවනතාවක් ද දක්නට ලැබේ.

(11) පොදු ජනතාව විසින් විශාල වශයෙන් තොරතුරු භාවිත කිරීම. ඔවුහු පාරිභෝගිකයන් මෙන් ම පුරවැසියන් වශයෙන් ද මෙම තොරතුරු භාවිත කරති. එමෙන්ම අධ්‍යාපනික හා සංස්කෘතික වශයෙන් මහජනතාවට ප්‍රවේශ විය හැකි තොරතුරු පද්ධතිවල ව්‍යාප්තියක් ද දක්නට පුළුවන.

(111) ආර්ථිකය තුළ තොරතුරු අංශය වර්ධනය වීම. තොරතුරු ක්ෂේත්‍රයේ කාර්යය වනුයේ තොරතුරු පහසුකම් හා සේවා සඳහා වන පොදු ඉල්ලුම සපුරාලීමය. මෙම ක්ෂේත්‍රයේ කැපී පෙනෙන කොටසක් විදුලි සංදේශන සහ පරිගණක ජාල වැනි තාක්ෂණික යටිතල පහසුකම් සමඟ බැඳී පවතී. සෑම තොරතුරු සමාජයක ම තොරතුරු ක්ෂේත්‍රයේ වර්ධනය සමස්ත ආර්ථික වර්ධන වේගය අභිබවා යනු පෙනේ. ජාත්‍යන්තර විදුලි සංදේශන සංගමයේ සංඛ්‍යාලේඛනවලට අනුව 1994 දී ලෝකයේ තොරතුරු ක්ෂේත්‍රය 5% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර සමස්ත ලෝක ආර්ථික වර්ධන වේගය 3% කි.

තනි තනි සමාජ තුළ සිදු වන මෙම විපර්යාසයන්ට වඩා එහි ජාත්‍යන්තර ස්වරූපය කැපී පෙනේ. විශ්වව්‍යාප්තව සිදුවන තොරතුරු පද්ධතිවල වර්ධනය මීට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකිය. චන්ද්‍රිකා විකාශ ක්‍රම ජාතිකමය සීමා මායිම් පිළිබඳ සැලකීමක් නොදක්වයි. විදුලි සංදේශන ජාල මගින් රටවල් හා මහාද්වීප එකිනෙකට සම්බන්ධ කෙරේ. මෙම ජගත් තොරතුරු පද්ධතිවල වර්ධනය මීට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකිය. මෙම ජගත් තොරතුරු පද්ධතියේ අවසාන නිදර්ශනය අන්තර්ජාලයයි.

සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද ක්‍රමයෙන් තොරතුරු සමාජ කරා ගමන් කරන සංක්‍රාන්ති අවධියක පසු වන බව පැහැදිලි ය. සාපේක්ෂ තරඟකාරීත්වය වර්ධනය කිරීමට සහ තරඟකාරී ලෝක වෙළඳපළ තුළ සිය තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා සෑම රටක් ම වැඩි වැඩියෙන් තොරතුරු භාවිත කරනු පෙනේ. ඕස්ට්‍රේලියාවේ සිට සිම්බාබ්වේ දක්වා විවිධ මාදිලියේ රටවල් දේශීය තොරතුරු කර්මාන්තය සක්‍රීය ලෙස වර්ධනය කිරීමට නිරතුරුව ම උත්සුක වේ. වර්ධනය වෙමින් පවතින තොරතුරු සඳහා වූ ජාත්‍යන්තර වෙළඳපලට සහභාගි වීමට හැකි වනුයේ එමගින් පමණක් වීම ඊට හේතුවයි. ආර්ථික හා සමාජයීය අභිවෘද්ධිය උදෙසා ගනු ලබන ප්‍රයත්න

මාලාවක් තොරතුරු සමාජයන්හි වර්ධනය මගින් නියෝජනය කෙරේ. සිංගප්පූරුව, ස්විඩනය හා දකුණු අප්‍රිකාව වැනි විවිධ ආකාරයෙන් ආර්ථිකය ගොඩ නැංවීමට කටයුතු කරන රටවල් තොරතුරු ආශ්‍රිත සමාගම් බිහි කරලීමට සුවිශේෂ සහායක් ලබා දේ. එමෙන්ම ඔවුන්, අධ්‍යාපන මට්ටම දියුණු කරන, ප්‍රජා සබඳතා ශක්තිමත් කරන සහ තීරණ ගැනීමේ දී මහජන සහභාගිත්වය වැඩි දියුණු කරන තොරතුරු පද්ධති නිර්මාණය කරමින් සිටී.

තොරතුරු සමාජයේ සම්භවය හා එය බිහි වීමට හේතු කාරක වූ සාධක සලකා බලන විට අන්තර් සම්බන්ධිත වර්ධනයන් දෙකක් හඳුනා ගැනීමට පුළුවන. එනම්, දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධනය සහ තාක්ෂණික විපර්යාසයයි. දීර්ඝ කාලීන වශයෙන් ඕනෑම ආර්ථිකයක් ව්‍යුහාත්මක වෙනස්කම්වලට භාජනය වේ. කෘෂිකර්මය මුල් කරගත් ප්‍රාථමික අංශයට ආර්ථිකයේ හිමි ස්ථානය ක්‍රමයෙන් නිෂ්පාදන කර්මාන්ත ප්‍රධාන කොට ගත් ද්විතීයික අංශය විසින් හිමිකර ගනී. අනතුරුව, වාණිජ හා සේවා කටයුතු නියෝජනය වන තෘතීය අංශය ආර්ථිකයේ පෙර ගමන්කරු බවට පත් වේ. එම අංශය මගින් ජාතික ආදායමට අති විශාල දායකත්වයක් සපයයි.

ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්වීම පිළිබඳ මෙම ක්‍රියාවලියේ සෑම අදියරයකදී ම ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවේ. සෑම ශ්‍රම ඒකකයකට ම අතිරේක වටිනාකමක් එක් වේ. ප්‍රාග්ධන ආයෝජන ඉහළ ගොස් ආර්ථිකය පුළුල් වේ. එමෙන්ම, ආර්ථිකයේ විවිධ අංශවල සාපේක්ෂ වැදගත්කම කැපී පෙනෙන වෙනස් කම්වලට භාජනය වේ. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩිපිළිවෙල් මානව සංවර්ධන වාර්තාවේ (1994) මෙම තත්ත්වය මනාව පෙන්වා දේ. සිංගප්පූරුව හා සෙනගාලය මෙන් ම තායිවානය හා හංගේරියාව වැනි බෙහෙවින් වෙනස් ආර්ථික රටාවන්ගෙන් සමන්විත රටවල සේවා අංශය දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වලින් 60% ක් පමණ හිමිකර ගෙන සිටින බව එහි දැක්වේ. ලෝකයේ අඩුවෙන් ම සංවර්ධනය වී තිබෙන රටවල පවා ආර්ථිකයට දක්වන දායකත්වය අනික් කෘෂිකර්ම (37%) හා කර්මාන්ත (20%) අංශ අභිබවා යාමට සේවා අංශයට (43%) හැකියාව ලැබී තිබේ. මෙම තත්ත්වය පරීක්ෂාවට ලක් කරන ඩැනියෙල් බෙල් වැනි ආර්ථික විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ පසුගිය අඩසියවසක පමණ කාලය තුළ තොරතුරු පිරිසැකසීම හා සම්බන්ධිත තෘතීය නැතහොත් සේවා අංශයේ විශාල වර්ධනයක් සිදු වී ඇති බව ය.

තොරතුරු තාක්ෂණය දිනෙන් දින ශක්තිමත් වන අතර, එය පුළුල් පරාසයක විහිදුණු නන්විධ කාර්යයන් සඳහා භාවිත කළ හැකි තාක්ෂණයකි. එමෙන්ම, පසුගිය වසර 20 තුළ තාක්ෂණයේ ධාරිතාව විශ්මය ජනක වේගයකින් ඉහළ ගොස් ඇත. නවද, තාක්ෂණය සඳහා වන වියදම ක්‍රමයෙන් පහළ බැසීම ද අඛණ්ඩව සිදු වේ. ඉහත කරුණු හේතු කොට ගෙන ක්‍රිස් ෆ්‍රීමන් වැනි ආර්ථික විද්‍යාඥයන් විසින් සන්නිවේදන තාක්ෂණය තොරතුරු සමාජයන්හි ආර්ථික වර්ධනයේ ගාමක බලවේගය ලෙස හැඳින්වීමට රුචියක් දක්වයි.

මෙම තාක්ෂණික ප්‍රවර්ධනය බොහෝ රටවල රැකියාවන් කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. ප්‍රාථමික හා ද්විතීයික අංශයන්හි ශ්‍රමයට හිමි ස්ථානය යන්ත්‍ර සූත්‍ර විසින් අත් පත් කර ගෙන තිබේ. තොරතුරු සමාජයන්හි ද මීට සමාන තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතිනු දක්නට පුළුවන. කාර්යයන් ස්වයංක්‍රීයකරණයට ලක්වීමත් සමග ලිපිකරු සහ පරිපාලන අංශයන්හි සේවා නියුක්තිකයන් රැකියා අහිමි වීමේ තර්ජනයට මුහුණ දී සිටී. දියුණු රටවල් විද්‍යුත් මූල්‍ය සංසරණ ක්‍රම හඳුන්වා දීමත් සමග බැංකු ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා උත්පාදනය සීඝ්‍රයෙන් පහළ බැසීම මේ සඳහා එක් නිදසුනකි. මෙසේ රැකියා අහිමි වන්නන්ගෙන් එක්තරා කොටසක් නූතන තාක්ෂණික ශක්‍යතාවන් ග්‍රහණය කර ගනිමින් තොරතුරු ආශ්‍රිත කර්මාන්ත කරා යොමු වන අතර එම තත්ත්වයන්ට අනුවර්තනය වීමට හැකියාවක් නොමැති අය හට මුහුණ පෑමට සිදු වී තිබෙනුයේ ඉමහත් වේදනාකාරී අසීරු කාල පරිච්ඡේදයකට ය. මේ අනුව පෙනී යන්නේ මෙම තාක්ෂණික ප්‍රවර්ධනය මගින් එක්තරා ජන කොටසක් සමාජ අනාරක්ෂිතභාවයට ඇද දමා ඇති බවය.

තොරතුරු ක්ෂේත්‍රයේ කර්මාන්තයක් වශයෙන් වර්ධනය වීම තොරතුරු සමාජයේ දක්නට හැකි තවත් ප්‍රධාන ලක්ෂණයකි. මෙම තොරතුරු කර්මාන්තයේ ස්වභාවය ත්‍රිවිධාකාර වේ.

### 1. තොරතුරු අන්තර්ගත කර්මාන්ත

බුද්ධිමය දේපල නිෂ්පාදනය හා වර්ධනය කරනු ලබන හා පෞද්ගලික සංවිධාන මෙන් ම පුද්ගලයන් මෙම කොටසට අයත් වේ. ලේඛකයන්, සම්පාදකයන්, සංස්කාරකවරුන්, ඡායාරූප ශිල්පීන්, කලාකරුවන්, රූපවාහිනී නිෂ්පාදකයන් විසින් නිර්මාණය කරනු ලබන මෙම තොරතුරු ප්‍රකාශකයන්, විකාශ ආයතන, බෙදාහැරීම් සහ නිෂ්පාදන සමාගම් වෙත අලෙවි කෙරේ. ඔවුන් විසින් බුද්ධිමය දේපළ නම් වූ අමුද්‍රව්‍ය විවිධාකාරයෙන් පිරිසකසා තොරතුරු පාරිභෝගිකයන් වෙත අලෙවි කරති.

### 2. තොරතුරු පරිවහන කර්මාන්තය

සන්නිවේදන පරිවහන ජාල නිර්මාණය සහ කළමනාකරණය මගින් තොරතුරු සන්නිවේදනය කිරීම මෙයින් සිදු කෙරේ. මෙම අංශයට විදුලි සංදේශ සමාගම්, රැහැන් රූපවාහිනී ජාල ආයතන, චන්ද්‍රිකා විකාශ ආයතන, සෙලියුලර් විදුලි සංදේශන සමාගම් සහ ගුවන් විදුලි සහ රූපවාහිනී ආයතන ඇතුළත් වේ.

පොත් වෙළඳුන් සහ පුස්තකාල ද අයත් මෙම කොටසටය.

## 3. තොරතුරු පිරිසැකසීමේ කර්මාන්තය

වර්තමානයේ තොරතුරු පිරිසැකසීම බොහෝ විට සිදු වනුයේ පරිගණක ආශ්‍රිතවය. මෙම අංශයට ප්‍රධාන වශයෙන් ම අයත් වන්නේ පරිගණක දෘඪාංග සහ මෘදුකාංග නිෂ්පාදකයන්ය. දෘඪාංග නිෂ්පාදක යන් විසින් පරිගණක , විදුලි සංදේශන උපකරණ නිර්මාණය, වර්ධනය, නිෂ්පාදනය හා අලෙවිය සිදු කරති. මෙම දෘඪාංග කර්මාන්ත බොහෝමයක් එක්සත් ජනපදයේ සහ නැගෙනහිර ආසියාව කේන්ද්‍ර කොට ගෙන බිහි වනු දක්නට පුළුවන. දෘඪාංග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් පද්ධති සහ පැකේජ නිර්මාණය හා නිෂ්පාදනය කිරීම මෘදුකාංග නිෂ්පාදකයන් වෙතින් සිදු වේ.

## තොරතුරු වෘත්තිකයන්

තාක්ෂණික විපර්යාසය සහ තොරතුරු කර්මාන්තයේ පුළුල් වර්ධනය හේතු කොට ගෙන තොරතුරු වේදීන්, පුස්තකාලයාධිපතීන් ලේඛනා රක්ෂකයන්, ප්‍රකාශකයන් වැනි වෘත්තිකයන්ගේ වෘත්තිකභාවයේ ද වෙනසක්ම් සිදු වෙමින් පවතී. විශේෂයෙන් තොරතුරු තාක්ෂණය ඔවුන්ගේ කාර්යයන් හි නිම්වළලු පුළුල් කර ඇත. එමගින් වැඩි තොරතුරු ප්‍රමාණයක් පිරිසැකසීමේ හැකියාව ද ලැබී තිබේ. එමෙන්ම, පරිශීලක අපේක්ෂාවන් ද ඉහළ නැංවී ඇති අතර ගුණාත්මකබවින් පිරිපුන් තොරතුරු සේවාවක් නිර්මාණය වෙමින් පවතී.

තොරතුරු වෘත්තිකයන් සඳහා අධ්‍යාපන සුදුසුකම් සහ මූලධර්ම පිළිබඳ අවබෝධයක් පමණක් නොව ඉහළ තාක්ෂණික හැකියාවන් ද අවශ්‍ය වීම මෙම විපර්යාසයේ එක් ලක්ෂණයකි. මේ නිසා අඛණ්ඩ අධ්‍යාපනය හා පුහුණුව මගින් සිය වෘත්තිකභාවය වැඩි දියුණු කිරීම සහ දැනුම යාවත් කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ. සංඛ්‍යාංක තොරතුරු භාවිතය ව්‍යාප්ත වීමත් සමග තොරතුරු ක්ෂේත්‍රයේ අනු කණ්ඩායම් බිහි වනු දක්නට පුළුවන. ඩෙක්ස්ටොප් ප්‍රකාශන පහසුකම් හරහා ලේඛකයන් විසින් ම තමන්ගේ ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම මේ සඳහා එක් නිදසුනකි.

ආයතනික කටයුතු සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් සම්පතක් ලෙස වර්තමානයේ තොරතුරු භාවිත වේ. කාර්යක්ෂම තොරතුරු කළමනාකාරිත්වය මගින් නව සොයාගැනීම් සඳහා ප්‍රබෝධයක් ඇති කරලීමෙන් නිෂ්පාදන වර්ධන වේගය වැඩි කිරීමක් සිදු වේ. එය ඵලදායිත්වය සහ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිතීන් ඉහළ නැංවීමට හේතු වේ.

ඵලදායිතාවය සහ තරඟ කාරීත්වය පෞද්ගලික ආයතනවල සාර්ථකත්වය හා බිඳ වැටීම තීරණය කරන සාධක හෙයින් ඔවුන් ආයතනික සම්පතක් ලෙසින් තොරතුරු භාවිත කිරීම කෙරෙහි බෙහෙවින් උත්සුක වනු දක්නට පුළුවන. නිෂ්පාදන කර්මාන්තයන්හි සාර්ථකභාවය සඳහා තොරතුරු විවිධාකාරයෙන් භාවිතයට ගත හැකිය. වර්තමානයේ බොහෝ ආයතනවල තිබෙන පර්යේෂණ හා සංවර්ධන අංශ විසින් තම ක්ෂේත්‍රයට සම්බන්ධ නවතම තොරතුරු එක් රැස් කෙරේ. නිෂ්පාදනයේ අනර්ගත්වය පමණක් ආයතනයේ සාර්ථකත්වයට හේතු නොවේ. එය වෙළඳපොළ අවශ්‍යතාවන්ට සරිලන පරිදි නිර්මාණය හා සංවර්ධනය කළ යුතුය. ඒ සඳහා වෙළෙඳපොළ පිළිබඳව උසස් දැනුවත්භාවයක් සහ විවිධ නිෂ්පාදන සඳහා පාරිභෝගිකයන්ගේ ප්‍රතිචාර පිළිබඳ මනා වැටහීමක් ද අවශ්‍ය වේ. පසුගිය වසර කිහිපය තුළ වෙළඳපොළ සමීක්ෂණ සීඝ්‍රයෙන් වර්ධනය වූයේ මෙම අවශ්‍යතාව සපුරාලීම පිණිසය. නිෂ්පාදන ව්‍යාපාරයන්හී වාණිජමය අංශවලට තොරතුරු තාක්ෂණය බෙහෙවින් බලපා ඇත. ගුවන් ප්‍රවේශපත්‍ර වෙන් කිරීම, රථවාහන වෙන් කිරීම, සංචාරක හෝටල්වල කාමර වෙන් කිරීම වැනි ක්‍රියාකාරකම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බල මහිමයෙන් ඉතාමත් පහසුවෙන් හා ඉක්මනින් සිදු කිරීමට හැකියාව ලැබී තිබේ. එමෙන්ම සමාගම්වල ඉල්ලුම සහ සැපයුම පාලනය කර ගැනීම උදෙසා ද තොරතුරු පද්ධති ආධාර වේ. මෙයට අමතරව තීරණ සහායක පද්ධති මගින් තීරණවල අවදානම අඩු කරලීමේ ශක්‍යතා ඉහළ ගොස් තිබේ.

රාජ්‍ය අංශයේ කර්තව්‍යයන් සඳහා ද තොරතුරු අතිශයින් වැදගත් වේ. එමගින් රාජ්‍ය අංශයේ සමස්ත ක්‍රියාවලියේ ස්වරූපය විප්ලවීය පරිවර්තනයකට භාජනය කළ හැකි බව වර්තමානයේ ජාතික හා ප්‍රාදේශීය මහජන අධිකාරීන් අවබෝධ කර ගනිමින් සිටී. එක් අතකින් එය රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වාණිජ ආයතනවල මට්ටමට රැගෙන යාමට දරන ප්‍රයත්නයක් ද වේ. ලිපිකරු සහ පරිපාලන කටයුතු ස්වයංක්‍රීයකරණය, තීරණ සහායක පද්ධති භාවිතය, විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය හරහා මෙම ඉලක්ක සපුරා ගැනීමට උත්සුක වන ආකාරය මනාව දර්ශනය වේ. අනෙක් අතට, සියලු කාර්යයන්හි ප්‍රජාතන්ත්‍රවාදය සහ සහභාගීත්වය සඳහා සුවිශාල බලපෑමක් මෙමගින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. සමහර රටවල මේ සම්බන්ධයෙන් විවිධ අත්හදාබැලීම් කරමින් පවතී. ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා විද්‍යුත් ක්‍රම සකස් කර තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළව මහජන සහභාගිත්වය ගවේෂණය කිරීම මීට එක් නිදසුනකි.

තොරතුරු සමාජය අධ්‍යාපනයට එල්ල කරන බලපෑමට සුළු කොට සැලකිය නොහැක. යුරෝපයේ තොරතුරු සමාජ පිළිබඳ නවතම වාර්තාවේ දනුමින් පිරිපුන් සමාජයක් බිහිකිරීමේ අවශ්‍යතාව දැඩිව අවධාරණය කර තිබේ. එමෙන්ම යුනෙස්කෝවේ විසි එක් වන සියවස සඳහා වූ අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර කොමිෂන් සභා වාර්තාවට අනුව අධ්‍යාපනික කටයුතුවලට තොරතුරු සමාජයේ බලපෑම විස්තර කර ඇත. තාක්ෂණික වර්ධනය හේතු කොට ගෙන ඉගෙනුම් හා ඉගැන්වීමේ ශිල්පක්‍රම කැපී පෙනෙන ලෙස

වෙනස්කම්වලට බඳුන් වී ඇත. බහු මාධ්‍ය සංගෘහිත නැටි භාවිතය මගින් පුලුල් පරාසයක විහිදුණු පුහුණු පාඨමාලා පැවැත්වීමට හැකියාව ලැබී තිබේ. එමෙන්ම සමහර අධ්‍යාපන ආයතන හා විශ්ව විද්‍යාල විද්‍යුත් තොරතුරු පරිවහන ක්‍රම උපයෝගී කොට ගෙන දුරස්ථ අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම පිළිබඳ අත්හදාබැලීම් කරමින් සිටී. ග්‍රාමීය ප්‍රදේශවලට ඉහළ විශේෂඥ තාවයෙන් යුත් පාඨමාලාවලට සහ වැඩිහිටි අධ්‍යාපන පාඨමාලා සඳහා මෙම තාක්ෂණික වර්ධනය බෙහෙවින් බලපා තිබේ.

තොරතුරු සමාජය සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි ද ප්‍රබල බලපෑමක් එල්ල කර ඇත. වඩාත් යහපත් සෞඛ්‍ය සේවාවක් පවත්වා ගෙන යාම උදෙසා වෛද්‍යවරුන්, රෝහල් කාර්ය මණ්ඩල මෙන්ම රෝගීන්ට ද ලෙඩරෝග, ප්‍රතිකාර ක්‍රම යනාදිය පිළිබඳ නවතම තොරතුරු අවශ්‍ය වේ. දියුණු සෞඛ්‍ය සේවාවන් නිරෝගී සමාජයක් ගොඩ නැංවීමට උපස්ථම්බක වන බව නොකිවමනාය. ආහාරවල ගුණාගුණ, රෝග ලක්ෂණ හඳුනා ගැනීම, රෝග වලක්වා ගත හැකි ක්‍රම, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට අනුදත් ක්‍රියාමාර්ග යනාදියට සම්බන්ධ ප්‍රජා සෞඛ්‍ය තොරතුරු සේවාවන් සඳහා බොහෝ සංවර්ධිත රටවල් සිය සමාජ සංවර්ධන ක්‍රියාවලිය තුළ ප්‍රමුඛස්ථානයක් ලබා දී තිබෙනුයේ උක්ත අභිමතාර්ථ සාධනය කර ගැනීම උදෙසාය.

## තොරතුරු හා පුරවැසියා

තොරතුරු එක් රැස් කිරීම සහ භාවිතය සමාජයේ ඕනෑම අයෙකුගේ දිනචරියාවේ එක් අංගයකි. පුරවැසියන් විසින් මෙම තොරතුරු භාවිතය විවිධාකාරයෙන් සිදු කෙරේ. පාරිභෝගිකයකු වශයෙන් වෙළඳ පොළෙන් භාණ්ඩ හා සේවා තෝරා ගැනීම සඳහා තොරතුරු අවශ්‍ය වේ. වර්තමාන ලෝකයේ වැඩි රටවල් ප්‍රමාණයක් අනුගමනය කරනු ලබන වෙළඳපොළ ආර්ථික රටාව නියමාකාර ඵලදායිත්වයෙන් යුක්තව ක්‍රියාත්මක වනුයේ වෙළෙඳපොළ පිළිබඳ මනා දැනුමින් සන්නද්ධ පාරිභෝගිකයන් සිටී නම් පමණි.

සාමාන්‍ය ජනතාවට සිය අයිතීන් රැක ගැනීම සඳහා තොරතුරු අවශ්‍ය වේ. මෙම තොරතුරු සංවර්ධිත සුබසාධක රාජ්‍යයන්හි බෙහෙවින් වැදගත් වේ. සමාජයෙන් සමාජයට වෙනස් වුයේ වුව ද පුරවැසියන් සතුව විවිධාකාරයේ අයිතිවාසිකම් පවතී. රැස්වීමේ නිදහස, භාෂණයේ නිදහස, ආගම් ඇදහීමේ නිදහස, අධිකරණ නිදහස වැනි සිවිල් අයිතිවාසිකම් මෙන්ම ඡන්දය ප්‍රකාශ කිරීමේ නිදහස වැනි දේශපාලන අයිතිවාසිකම් ද පුරවැසියන් සතුව තිබේ. එමෙන්ම සෑම පුරවැසියකුට ම අවම මට්ටමෙන් හෝ ජීවිතය පවත්වා ගෙන යාමේ අයිතිය ඇත. මිනිසා සතුව ඉහත සඳහන් ආකාරයේ සකලවිධ අයිතිවාසිකම් පවතින්නේ වුව ද සමාජයීය ව්‍යවහාරයේ දී ඒවායේ තත්ත්වය ඊට වඩා බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගනී. සමාජයේ සෑම පුද්ගලයකුට ම එම අයිතිවාසිකම් පිළිබඳ මනා දැනුවත්භාවයක් නොමැති වීම ඊට බලපාන ප්‍රධානත ම හේතුව ලෙස සැලකිය හැකිය. එයින් අදහස් වන්නේ එම අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු සමාජයේ සෑම තරාතිරමකම පුරවැසියන් වෙත නිසි පරිදි ගලා යාමක් සිදු නොවන බවය. මේ නිසා තොරතුරු සහ උපදේශක අයිතිය නම් වූ නවතම සිවිල් අයිතිවාසිකම් වර්ගයක් පිළිබඳව සාකච්ඡා කිරීමට සමහරුන් පෙළඹී සිටිති. මන්ද තොරතුරු පිළිබඳ අයිතිය නොමැතිව අනෙකුත් අයිතිවාසිකම් යථා පරිදි ක්‍රියාත්මක කිරීම දුෂ්කර බැවිනි. ප්‍රංශය එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය වැනි රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් මෙම අයිතිය තහවුරු කර ඇත.

මෙම ක්‍රියාදාමයේ වර්ධිත අවස්ථාවක් ලෙස රාජ්‍ය තොරතුරු වලට ප්‍රවේශ වීමේ අයිතිය හැඳින්විය හැකිය. පුරවැසියකු ලෙස සිය අයිතීන් භුක්ති විඳීමට අවශ්‍ය තොරතුරු මීට ඇතුළත් වේ. උදා: රටේ නීතිමය පද්ධතිය පිළිබඳව පුරවැසියන් සතුව මනා අවබෝධයක් නොමැති විට නීතිමය අයිතිවාසිකම් යන්න නිසි පරිදි ක්‍රියාත්මක නොවේ. එමෙන්ම පුරවැසියා සතු තොරතුරු දැන ගැනීමේ අයිතිය ඔවුන්ගේ ආර්ථික ශක්තිය, භාෂා හැකියාව, හෝ සාක්ෂරතා මට්ටම මත රඳා නොපැවතිය යුතුය.

තොරතුරු සමාජය වර්ධනය වීමත් සමග සමාජයීය විභේදනයක් ද සිදු වන අයුරු දැකිය හැකිය. එනම්, තොරතුරුවලට ප්‍රවේශවීමට හා භාවිත කිරීමට හැකියාව තිබෙන හා නොතිබෙන ජනතාව වශයෙනි. දුප්පත් හා ධනවතුන්, මහාජාතීන් හා සුළු ජාතීන්, සෞඛ්‍ය සම්පන්න හා ආබාධිත වශයෙන් සමාජයේ දැනටමත් පවත්නා බෙදීම් එමගින් තවදුරටත් විස්තීරණ වන බව අයෙකුගේ මතයයි. තොරතුරු සඳහා ප්‍රවේශවීමට විවිධ මට්ටමේ බාධක පැවතියේ වුව ද එම බාධාවන් ජය ගැනීම සඳහා සේවාවන් වර්ධනය කිරීමේ අවශ්‍යතාව ක්‍රමයෙන් සමාජය විසින් අවබෝධ කර ගනිමින් සිටී. සාක්ෂරතාව වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපනික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, සුවිශේෂ ප්‍රජා කණ්ඩායම්වල අවශ්‍යතාව ඉටු කරලීමට තොරතුරු හා උපදේශක සේවා සැපයීම නිදසුන් ලෙස දැක්විය හැකිය.

එළඹෙන 21 වන සියවස තුළ සමාජ ප්‍රගමනය උදෙසා තොරතුරු මගින් ඉටු කරනු ලබන කාර්යභාරය කවර ස්වරූපයක් ගන්නේ ද යන්න පිළිබඳව අනාවැකි පළ කිරීම අතිශයින් ම දුෂ්කර ය. මක් නිසාද යත්, තොරතුරු සමාජයන්හි හැඩරුව බොහෝ දුරට තීරණය කරන ප්‍රබලතම සාධකය ලෙසින් සැලකෙන සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍රගාමී දියුණුව ගමන් කරන දිශාව පිළිබඳ පූර්ව අදහසක් ඇති කර ගැනීම උගහට බැවිනි.

(World information report 1997/98 හි Nick Moore විසින් රචිත Information Society නම් ලිපියේ ඡායානුවාදයකි )

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

කොළඹ 07, අංක 14, නිදහස් මාවතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පර්යේෂකයන් සහ විද්වතුන් සඳහා විවෘතව පවතී. මෙය අපගේ ජාතික පුස්තකාලය බැවින් රටේ ඕනෑම පෙදෙසක වෙසෙන පාඨකයන් හට එය භාවිතා කළ හැක. පහත දැක්වෙන එකතුන් ජාතික පුස්තකාලය සතුව පවතී.

- ※ විමර්ශන ග්‍රන්ථ - විශ්වකෝෂ, ශබ්ද කෝෂ, වාර්ෂික ග්‍රන්ථ, සිතියම් සහ දුර්ලභ කෘතීන්
- ※ පුවත්පත් (1976 වසරේ සිට) සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ කාලීන ජාත්‍යන්තර පුවත්පත්.
- ※ වාර සඟරා - දේශීය සහ විදේශීය
- ※ ජාතික සහ අන්තර් ජාතික ප්‍රවෘත්ති සඟරා
- ※ විද්‍යා හා තාක්ෂණික ග්‍රන්ථ එකතුව
- ※ පුස්තකාල විද්‍යා ග්‍රන්ථ එකතුව
- ※ යුනෙස්කෝ පොත් එකතුව
- ※ පැරණි පුස්කොළ පොත් එකතුව
- ※ ආර්ථික විද්‍යා, දේශපාලන විද්‍යා , සමාජ විද්‍යා ,ආගම්, භාෂා, සාහිත්‍ය, භූගෝල විද්‍යා, ඉතිහාසය, චිත්‍ර, කලා සංගීත සහ ක්‍රීඩා පොත්පත්
- ※ පරිගණක සහ විමර්ශන සේවා (CDROM) Science Citation Index, Library & Information Science Abstracts (LISAP LUS) HORTCD' and ' Current Contents on Diskette.'
- ※ සේවාවන් : විමර්ශන, ලේඛන සැපයීම්, අන්තර් පුස්තකාල පිරුළු ග්‍රන්ථ විඥාපන, ඒකාබද්ධ සූචිය සහ වෙනත් පුස්තකාල සේවා
- ※ ආයතන සඳහා විශේෂ සාමාජිකත්ව පහසුකම් සැලසේ

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය**
**අඟහරුවාදා සිට සෙනසුරාදා**
**දක්වා**
**පෙ.ව. 9.00 සිට ප.ව. 5.00**
දක්වා විවෘතව පවතී


විස්තර සඳහා :
අංශ ප්‍රධාන
පාඨක සේවා අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
අංක 14, නිදහස් මාවත
කොළඹ - 07

දුරකථනය අංක : 685199, 698847 ෆැක්ස්: 685201


# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

මඟින් ප්‍රකාශිත

# ඩිවි දශම වර්ගීකරණය

## 21 සංස්කරණය

සංක්ෂිප්ත සිංහල පරිවර්තනය




**මිල රු. 250/-**

හැඳින්වීම, උපලේඛන, ප්‍රමිත උපබෙදුම්, භූගෝලීය කලාප,
සාපේක්ෂ අනුක්‍රමණිකාව ඇතුළත්ය

පුස්තකාලයක් විද්‍යාත්මකව සංවිධානය කිරීමේ දී අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු ග්‍රන්ථයකි. මෙම ආයතනයේ ජාතික පුස්තකාල පොත්හලින් හෝ රු. 10/- ක අමතර මුදලක් ගෙවා වී.පී.පී. මඟින් ලබා ගත හැක.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත
කොළඹ 07.

අධ්‍යක්ෂ ජනරාල්

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/10

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : 

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : 

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*